4 වෙළුම | 1963 නොවැම්බර – 2507 ඉල් | 8 කලබ

පටුන

ළමා පතපොත.

හෝරාව — ඊලියන් ද සිල්වා [සොයුන් විදූ (B. Sc. (Eng.) Lond.) A. M. I. E. E.]

'ඇ'ගේ පැමිණිල්ල — කුමරතුඟු මුනිදස්

කවි ජාවාරම — දනුම සගරායෙනි

දිනක් හිරු නො පායා වූ අවුල — ඊ. තෙන්නකෝන්

සත් නමු වහර — අරියෙන් අහුබුදු

මානවසිංහ ගේ වෙසක් මීහිර — නුවන්සිරි ජයකුරු

සිරි නේරු සිරිත — වී. ජ. මු. ලොකුබංඩාර

දුහුන පබඳ —

සිව-හෙළය — වෙල්ලාල ජයමහ

අසරණ හදවත — විනී විතාරණ [විදුදය සරසවියේ වදරු]

පාරිභාෂික පවලැවිල්ල —

කුමාරතුංගයන් ගේ ධී ශක්තිය — ක. රූපසිංහ

නිතිය — දමමින්

පහදුව —

ඉල් මස —

මිල සත 50 යි

වෙලෝනා ඇඳුම් පාවිච්චි කරන්න!

පිරිමැස්මදයක, කල් පවතින වෙලෝනා ඇඳුම් සැහීම ගෙන-දෙන අතර, පවතින මුළු කාලය තුළ ම ඉස්තරම් කමෙන් හීන නො වෙයි. පුරුෂයනට, කාන්තාවනට හෝ ළමයිනට සරිලන වෙලෝනා ඇඳුම් ඇත. ඉස්තරම් දේ වුවමනා අයට වෙලෝනාවලට වඩා උසස් වර්ගයක් ලබා-ගැනීමට නොහැකි ය.

නිෂ්පාදනය කරන්නේ

සීමා සහිත ලංකා වීවිං මිල්ස්

වෙලෝනා — මොරටුව.

ඔබට ඕනෑ

● අලුත් බඩු ද?

● පරණ බඩු ද?

දෙකට මැ

මෙන්න එක මැ තැන

අලුත්කඩෙ

සන්ත බස්තියන් කන්දේ – 32

ජයසිංහ

වෙන්දේසි පොළ

ටැලිපෝන් 78904.

එඩියෙත් දැනුමට

දැනුමෙත් එඩියට

පත් වන්නට කියවන්නෑ

'එ ඩි ය'

පිටපතෙකැ මිල සත 50 යි

පහිණ මිල සත 10 යි

කලප් 12 කැ ගනු මිල රු. 6.00 යි.

පහිණ මිල සමහ යි

සීමා සහිත

ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

කොළොඹ - මහනුවර - ගාල්ල

මීගමුව - අනුරාපුර - මාතර.

ළමා පතපොත

"කුඩවුනට දෙවෙන දූය මහවුනට දෙවෙන දූයට වඩා පිරිසුදු බව පතා-සිටී. එහි කිසි යම් නොපිරිසුදු බවෙක් වේ නම් එය කල් තබා මැ අස් කැරු-ලීම දෙන්නහු ගේ ලොකු මැ යුතු කම වෙයි." — යනු ජයන්ත විරසේකර සූරීන් ගේ කියමනෙකි.

(-එඩිය, 1 වෙළුම, 12 කලඹ, 1940 ජනවාරි)

මේ හැඟුම ඔවුන් පළ කෙළේ මෙයට තෙ විසි වසකට උඩැ දී යැ; මෙ රටේ කුඩාවුන් සඳහා ලියැවී තුබුණු පතපොතේ තතු සලකා යැ; වෙසෙසින් මැ ළමා පතපොත ලියැවී ඇති බස් වහර සලකා යැ යි සිතමි.

මේ අතින් අද තතුව කෙ බඳු ද? අපි කො තෙක් දූර පෙරට ගොස් සිටිමු ද? නැත හොත් පෙරට යමු යි කියා පස්සට මැ ගියමෝ වෙමු ද?

අද රටේ ඉතා පළ බවට ගිය කියවන-යෙකින්[1] නඟා-ගැනුණු පහතැ පෙනෙන නිදසුන දෙස බැලීමෙන් ඒ අතේ තතු සලකා-ගත හැකි යැ.

"'ඈ ඔහුගේ අලුත් මේස් දෙක ද සපත්තු දෙකද අන්දවා ඔහුගේ හිස පීරුවා ය.' (2 පිට).

'ඈ ඔහු ගේ හිස පීරුවා ය' යනා මේ වැකිය නිවැරැදි ද? පීරුවා ය යනු උක්ත පදයක් ගන්නා ගණයේ කිරිය පදයෙකි. එහෙත් එහි උක්තය ලෙස තබා ඇත්තේ අනුක්ත පදයෙකි. 'She combed his hair යන්න වෙනුවට 'Her combed his hair යැ යි යමකු යොදතොත් එ බසෙහි ලා ඔහුට කවර තරමේ සැලැකිල්ලෙක් ලැබේ ද? එහෙත් ඒ එ බසෙහි යැ!

'මේස් දෙක ද සපත්තු දෙක ද අන්දවා' යනුත් සිංහල ද? ඉංගිරිසියෙන් නම් රෙදි පිළීත් ඇඳීමෙකි; මේස් සපත්තුත් ඇඳීමෙකි. එහෙත් සිංහලයෙන් නම් මේස් සපත්තු ඇඳුම් නො වේ; පැළැඳුම් යැ.

තුප්පහි සිංහලයාට පවා ඔහු ගේ සිංහලයත් සිංහලය සේ සිතෙනාවා වියැ හැකි. එහෙත් සිංහලයාට ඒ එ සේ නො වියැ යුතු. ඔහුට ඔහු ගේ බසේ සැහිරිය (Idiom) වැදගති. වෙසෙසින් මැ කුඩා දරුවන් අතට පැමිණෙන පොත්හි සිංහල සැහිරිය රැකීම ඉතා වැදගත් කරුණෙකි.

මෙහි, අන්දවා යනු ද, දක්කවා, බස්සවා කප්පවා, වඩම්මවා යන වල්ලේ මැ අප පදයෙකි! ඉහතැ සඳහන් වැකියේ, 'ඔහුගේ' යන 'සර්වනාම පදය, දෙ වරක් මැ යෙදුණු සේ ද ගුරු ක්‍රමට ගත යුත්තෙක් නො වේ.

කිරිය කරු සබඳ දෙදූරු වැකි දෙළොසෙකි මේ මුල් පැටුමෙහි මැ. සෙසු පැටුම්හි ද තතු එ අයුරු යැ.

මෙ බඳු පතපොත අප ගේ දරුවන් අතට යැවීම දූයට කරන බලවත් මැ අපරාදයෙකි. ළමා පතපොත ලියන්නවුන් විසින් ජයන්ත වීරසේකර සූරීන් ගේ මේ කියමන ද සලකා බලනු වටී.

"දරු සිත නොවියැළුණු මැටි පිඩක් බඳු යැ යි කියති. එ මැටි පිඩෙහි රුවක් අඳින්නට යතන්නහු, එ මැටි පිඩෙන් රුවක් හඹන්නට යතන්නාහු, සිය කටයුත්තෙහි ලා කො තරම් ඉවැසිලිමත් වියැ යුතු ද යනුත් කො තරම් පරෙස්සම් වියැ යුතු ද යනුත් කියුව මනා නො වේ."

1. නව මග කියවීම් පොත් — එච්. ඩී. සුගතපාල දෙවෙනි ප්‍රමාණය

හෝරාව

ඒලියත් ද සිල්වා

ඉරු උදු වී බැසැ යන තෙක් කල දහවල ලෙස ද ඉරු බැසැ යළි උදු වන තෙක් කල රැය ලෙස ද කැපී පෙනෙයි. ඉඳුරා දිස්වෙන, සොබා දහමේ ඒ දෙ-සලකුණ, ගෙවී යන කාලයා ගේ තරම මැනීමට ඉවහල් වන මිනුම් දඬුවක් සපයයි. රැයත් දවාලත් ලෙසින් හැඟැවෙන කල් පමණ එක් දවසක් ලෙස යැ ගැනෙනුයේ. මේ දවස ලෙසින් හැඟැවෙන කල් පමණ විසි හතර කොටසකට බෙදුව, ඉන් එක කොට-සෙක් හෝරාවෙකි. එක් හෝරාවක් කොටස් දෙකහමාරකට බෙදූ විටැ ඉන් එක් කොට-සෙක් පැයක් සේ හැඳින්වෙයි. එ බැවින් දවසකට හෝරා විසි හතරෙකි; පැය සැටෙකි. එක් හෝරාවකට පැය දෙකහමාරෙකි.

යවන (ග්‍රීක) බසෙහි දූ හෝරාව යන්න හැඟැවෙනුයේ ''හෝරා'' යන යවන වදනින් යැ. ඉංගිරිසි ''අවර්'' (Hour) යන වදන තැනුණේ මේ යවන ''හෝරා'' යන්නෙනි. ඉදින්, ඉංගිරිසි ''අවර්', යන්න 'පැය' යන සිංහල වදනින් හැඳින්වීම කො තරම් වරදෙක් ද? දවසකට ඉංගිරිසි 'අවර' විසි හතරෙකි, එහෙත් සිංහල පැය සැටෙකි. මේ කරුණ සලකන විටැ යැ, ඒ වරදේ තරම කො තරම් දැ යි වැටැ-හෙනුයේ.

කල් මැනුම් අද ඊයේ ඇරැඹුණෙක් නො වේ. ඉහත්තේ සිටැ මැ කල් මැනීමට මිනිසා වෙහෙසුණේ යි. ඒ කාරියට නොයෙක් උවාරණ ද ඔහු විසින් තැනුණේ යි. සිදුරක් ඇති බඳුනකට දිය පුරවා එහි දිය මට්ටම වෙනස් වන අයුරින් ගත වන කල වටහා - ගන්නට පිළිවනි. මේ උවාරණය සිංහලයන් විසින් වැඩට ගත් පැ-තැටිය යි. සිංහලයන් විසින් කල් මැනීමට යෙදූ තව ද විදියෙක් නම් සෙවණැල්ල පියවර ගණනින් මැනීම යි. මෙ වන් පිළිවෙත් යොදු ඉහත්තේ සිටි අන් රටවලැ මිනිස්සු ද කල් මිනුම කළෝ යි. එහෙත්, ඔරලෝසු බෝ වෙත් මැ මේ ඉපැරැණි කල් මිනුම් විදි අත් හැරුණේ යි. ඒ ඉපැරැණි විදිවලට වඩා සරි ලෙස ඔරලෝසු කල් මනියි. එ සේ වතුදු, කල් මිනුමේ පදනම ඔරලෝසු මතැ රැඳුණෙක් නො වෙයි. කො තරම් සියුම් ලෙස තැනූ ඔරලෝසුවක් වුව ද ඉසරි ලෙස කල් මැනුමට පොහොසත් නො වෙයි.

රැයත් දවාලත් එක් වූ තැනැ එක් දවසක් සේ ගැනෙන වග පෙරැ කීමු. එහෙත් එයට වඩා සරි ලෙස 'දවස' යනුවෙන් හැඟැවෙන කල් පමණ දැනැ-හැඳිනැ-ගැන්ම ඇවැසි යැ. කෙ සේ ද දවස ඇති වනුයේ? බමරයක් ගැසූ විටැ එය බමන හෙවත් කරකැවෙන අයුරින් . අප ගේ පොළොව ද නිරතුරු වැ මැ බමයි. එසේ බමමින් මැ ඉරු වටා යෙයි; හෙවත් ඉරු වටා පිරිබමයි. ඒ බැවින් පොළොවෙහි ගමන දෙ-අයුරු යැ. බැමුම එකෙකි; අනෙක නම් පිරිබැමුම යි. පොළොවෙහි යම් පැත්තක් හිරු දෙසට හැරී ඇත්තේ ද ඒ පැත්තට හිරු එළිය වැටී දවහල් වෙයි. අනෙක් පැත්තට හිරු එළිය වැටෙන්නේ නැති. එ බැවින් ඒ පැත්තට ඇත්තේ රැ කල යි. එහෙත් පොළොවේ බැමුම නිසා හිරු දෙසට එල්ල වූ පැත්ත කෙමෙන් කෙමෙන් කරකැවී යෙයි. එ විටැ ඒ පැත්ත රැ කල ලබයි. මෙ සේ යැ රැ දහවල හට ගන්නේ. යම් මොහොතෙකැ දී පොළොවෙහි කිසියම් තැනක් හිරු දෙසට එල්ල වූ සේ ගනිමු. එ තැන එක් වටයක් කරකැවී ඉක්බිති වැ ඉරු දෙසට පෙරැ සේ එල්ල වන විටැ එක් දවසෙකැ කලක් ගෙවුණු සේ ගැනෙයි.

මෙහි ද මඳ අඩුවෙක් වෙයි. ලකුණක් සේ ගත් පොළොවෙහි කිසියම් තැනක්, එක් වටයක් යන කල තුළැ දී පොළොව ඉරු වටා මයිල 15,00,000 කැ දුරක් පිරිබමා ඇති. එ බැවින් එ තැන යළි ඉරු දෙසට එල්ල වනුයේ පොළොව එක් වටයකට වඩා තව ද ටිකක් බැමූ පසු යි. තව ද තරු අතුරෙන් අප ගේ හිරු කුඩාවකු වුව ද එය අපට දිස් වනුයේ අන් තරුවලට වඩා බෙහෙවින් ලොකුවට යැ. අන් තරුවලට වඩා හිරු අපට කිට්ටු වීම යැ මෙයට හෙය වනුයේ. ඉදින් පොළොවෙහි යම් තැනක් හිරු දෙසට එල්ල වන සේ ගැන්මට මෙය සරසෙකි. ඉරු ලොකුවට පෙනෙන හෙයින් මඳ කලක් තිස්සේ මැ එ තැන හිරුට එල්ල වැ පවත්නා සේ යැ දිස් වනුයේ. කරුණු මෙ සේ හෙයින් පොළොව එක් වරක් බැමෙන කල් පමණ මනින්නට හිරු ගෙන් පිහිට පැතුම නුසුදුසු යැ. ඒ කල් පමණ නිසි අයුරු වටහා - ගන්නට නම් අහසෙහි එළි තුඩක් සේ දිස්වන යම් කිසිවෙකැ වහල පැතියැ යුතු වෙයි.

එ බැවින් හිරු සබැඳි වැ කල් මිනුම හැර අන් තරුවක් සබැඳි වැ ඒ කටයුත්ත කැරගැන්මට සිදු වේ. අප ගේ හිරු හැරුණු විටැ ඉක්බිති වැ කිට්ටු තරුව පිහිටා ඇත්තේ මයිල 2,60,00,00,00,00,000 ක් පමණ දුරිනි. පොළොවෙහි සිටැ හිරුට ඇති දුර පමණ මයිල 9,30,00,000 කි. ඉක්බිති වැ කිට්ටු තරුව වුව ද ඉරුට වඩා බොහෝ දුරින් පිහිටා ඇති හෙයිනුත් එය අපට එළි තුඩක් ලෙය පෙනෙන හෙයිනුත් අප කට යුත්තට තරුවක් මැ ගැනුම සුදුසු වෙයි. ඉරු සබැඳි වැ මනනා දවස "හිරුයුරු දවස" (Solar Day) ලෙසත් තරු සබැඳි වැ මනනා දවස (තරුයුරු දවස) (Sidereal Day) ලෙසත් හැඳින්වේ.

මෙ සේ කල් මැනුමට තෝරාගත් තරුවලට කියනුයේ කල් තරු කියා යි. ලොවේ සුපතළ නිරික්සුම් හල්වලැ (Observatories) කල් මිනුමේ කාරියට මැ කැප වූ තෙලික්සු (දුරදක්නා) වෙයි. එළි තුඩක් සේ දිස් වන කල්-තරුවක් මේ තෙලික්සුවට පෙනුණු විටැ, නිරුක්සුම් හලෙහි ඇති ඔරලෝසුවෙහි අඩු-පාඩු කම් අනුවැ ඔරලෝසුව දිසිටුවයි (අදි + සිටු = අදිසිටු = දිසිටු= Adjust) මෙ සේ ඉසරි ලෙස දැනැගත් වේලාව රේදෙව් මඟින් ලොවට පැවැසෙයි. එ සේ නිරික්සුම් හල් මඟින් ලැබෙන කල්-තොරතුරු අනුවැ යැ ඔරලෝසුවලැ වේලාව දිසිටුවනුයේ.

තව ද සැලැකියැ යුතු කරුණෙක් වෙයි. පොළොවෙහි සැම තැනැ මැ එක් විටැ එක් මැ වේලාව නො වෙයි. එක් වටයෙකැ අස් (අංශක, degrees) 360 කි. එක් වටයක් යනුයේ හෝරා විසි හතරෙකිනි. එ බැවින් එක් හෝරාවක් තුළැ දී පොළොව අස් $\frac{360}{24}$ හෙවත් 15 කරකැවෙයි. මින් පෙනෙනුයේ අස් 15 කැ පරතරයක් ඇති දෙ තැනෙකැ වේලාව එක් හෝරාවෙකින් වෙනස් වන වග යි. මේ ගැටලුව නිසා මුළු ලොව මැ අස් 360 කට බෙදු ඇති. එංගලන්තයේ ග්රිනිච් (Greenwich) නම් පළාත 0° සේ ගෙනැ ඇති. ග්රිනිචයට දකුණෙන් පිහිටා ඇති රටවලැ ඉවේලාව, වමෙන් පිහිටා ඇති රටවලැ වේලාවට වඩා, වැඩි වෙයි. 180° "වන තැන දැබැඳි දින ඉර" (International Date line) සේ ගෙනැ ඇති. මේ ඉරෙන් වමට ගිය විටැ එක් දිනක් වැඩි වෙයි, දකුණට ගිය විටැ එක් දිනක් අඩු වෙයි. නැවෙකින් ලෝ වටා යන විටැ මේ අනුවැ ඔරලෝසුවෙහි වේලාව එහා මෙහා කරන්නට සිදු වෙයි.

නිරික්සුම් හල්වලින් ලැබෙන කල් තොරතුරු අනුවැ ඔරලෝසුවෙහි වේලාව තබා-ගත හැකි වග ද පෙර සඳහන් විණි. ඒ හැර ඔරලෝසුව ද සුදුසු සම වේගයෙන් වැඩ කළ යුතු වෙයි. එහි වේගය හසුරුවන්නට ගොවුනුරුවක් (Governor) ඇවැසි යැ. මේ කාරිය කරන ගොවුනුරු-

වෙකි ඔරලෝසුවෙහි සමහර විටැ දක්නා ලැබෙන පැදිලඹය (Pendulum). 1580 වෙ දී පමණ, ඉතාලියෙහි පීසා නම් නගරයේ දෙව්මැඳුරෙකැ පූජාවට හවුල් වූ තරුණයෙක් එ මැ මැඳුරේ එලෙන පහනක් පැදෙන අයුරු දිටි. එය නිරික්සූ ඔහුට පැහැදිලි වූ කරුණෙක් නම් කො තරම් දුර පහන පැද්දුණ ද එක් වරක් පැද්දීමට යන කල් පමණ හැම විටැ මැ සම වන බව යි. තම නිවෙසට පැමිණි පසු ද එය අත්-හද බලා ඒ සොබා දහමේ රහසෙන් වැඩක් ගත යුතු සේ සිතුණේ ඔරලෝසුව හසුරුවන්නට සුදුසු පැදිලඹය හේ නිපැදුවේ යි. ඒ තරුණයා නම් පසු වැ ලෝ පතළ වූ ගැලිලියෝ නමැත්තා යි. මෙ සේ කෙමෙන් කෙමෙන් දියුණු වූ ඔරලෝසුව දත් ඉතා සියුම් සේ තැනුණු උවාරණයෙකි. එහෙත් එය කො තරම් සියුම් ලෙස තැනුණ ද එහි ද වේලාව හරිගස්සනුයේ, අහස නමැති සොබා දහමේ ඔරලෝසුවෙහි තරු නමැති කටු පවසන කල් පුවත අනුවැ යි.

* * * *

"ලියයි, ඇදී-
    යන ඇඟිල්ල;
ලියමින් ඇදී-
    ඇදී මැ යෙයි.

ඔබ පඬි බව, සිල්වත් බව
    යළි ගෙන්වා ඒ ඇඟිල්ල
ලියූ දෑ මකවා ආයෙත්
    පෙරළා ගමන් කරවනු නැත්."

-ඔමාර් ඛයියාම්

'ඇ'ගේ පැමිණිල්ල

කුමරතුඟු මුනිදස්

වී ර ක සතුරු ගණ ගන
වනයෙහි වැස් වූ
තාරක දිය ඉසුරු කලැ
ලකැ නොසැ'විස් වූ
මාරක දෙමළ බළ
පැමිණැ ද ගුණ හිස් වූ
මාරක වරණ සිත පඩි
දන පසු බැස් වූ

රා වණ දස කිරුළු හිමි සඳු කලැ දීපේ
කා රණ බියට සතුරන් ගෙන් වියැ නාපේ
ඒ වුණ නමුදු උන් ගිය කලැ සහකෝපේ
මා ගුණ රැකිණ වී සැම රුපු දෙස ලෝපේ

සොර මුළකට අසු වැ අප රට මැනෙකැ දී
ක ර දර පැමිණියද වස් ගණනක් මැ බැඳී
නා ර වර පඬු අබා උන් පරලොවට පිදී
අ ර ණට මා හරන සිත එකෙකුදු නො වැදී

ඉ න් පසු වැ ද මෙ රට
සතුරෝ කිහිප වරක්
ව න් නු යැ වනුව සිංහල
කඩු යකුන'හරක්
උන් කට ලකට කලකට
වන් නො වී බරක්
ඉ න් නට මට ලැබිණ නො වැ
මගෙ බලෙහි තොරක්

ග ජ බා රජ ලකට දූකැ කළ අවමානේ
සි ය බා බලය පා දෙමළුන් හට රැනේ
ගොඩබා උනට අප රටැ බිම කැරැ දනේ
පසු බා සිටින්නට මට සැලැසියැ මානේ

සි හ ළ කටින් පියෙවින්
කියැවෙයි 'ඇ' යනු
දෙ ම ළ කටට නම් ඒ
පෙළහරෙක් මැ නු
කොමළ සිහළ බස රස
මිහිර වි උනු
ක ස ළ දෙමළ තැවැරී
කැත වුව යි දනු

වෙ සෙ ස් ලකුණක් වැ සිටි
මා සිහළ බසේ
කොරොස් දෙමළ කට නො
ලැගෙනු කටෙහි දෙසේ
පි ස ස් ගෙදැරැ සුර කුමරෙක්
කෙලෙස වෙසේ
නැ ණැ ස් යොමා තතු නො
බලනු කිමැ අනිසේ

අගට ද මා නරක නැහැ
නැහැ යනුයෙන් ම
මුලට ද මා නරක නැහැ
වැටැහේ ඉන් ම
මැදට ද නැහැ නැණැති
කරවයි එය දූන් ම
කුමට ද මට රවනු දූකැ මේ
බස් ගැන් ම

දෙමළුන් ලියූ පොත් දූකැ මා
නො මැ සලකා
සිහ ළුන් සිවලුන් වැ කිමැ
යනු ඒ මහ නකා
වන සත් නට සිහළ බස
එක ලකුණ මකා
යත නින් කැරෙන පිය ගුණ
ගත හැකි යැ රැකා

'ඇ'යනු 'ඇ' යනුත් මදි වී
නව දිගට
අ දී නු සිරිති බිලිඳා
පහළ වැ ලොවට
කි යනු බැරි වැ ඇද වෙයි
පිය දෙමළ කට
මෙමැනු කරුණ වියතුන් ගේ
සිනාවට

නොදත් තවුන් කුම කීවත්
බස දන්නා
වි ය ත් ද නත් ඇත හොත්
දැ රැකැ- ගන්නා
ම ට ත් ඔ වුන් පිහිට යැ
දෙමළුන් වන්නා
ස ම ත් වූ වන් දූකැ
සිරිත යැ බා යන්නා

(-කුමාර පද්‍ය සංග්‍රහය)

කවි ජාවාරම

රොබට් ග්රේව්ස්

දනට 'ඔක්ස්පඩ්' සරසවියේ සිසුනට කවි පිළිබඳ දෙසුම් පවත්වන්නේ ලෝ පතළ සමත් සාහිත විචිසුවකු වන රොබට් ග්රේව්ස් යැ.

කවියේත් සාහිතයේත් දියුණුවට අලුත් මං සෙවීමේ මුවාවෙන් ගෙනැ-යන සාහිත ජාවාරම විචිසුවට ලක් කැරෙන

මෙ ලිපිය උපුටා-ගැනුණේ 'දනුම' සඟරාවෙනි.

මෙය විසාල රටෙකි; ගැටලුවක් බඳු රටෙකි. මේ රට ගැන කුමක් කිව ද, එකිනෙකට විරුදු දෑ කිව ද, එය දන්නා ලීලාවෙන් කැරේ නම් ඇත්තක් සේ මැ හැඟියන්නේ යි. කිසිවකු හැඟැවූව ද, හැඟැවූ පමණින් අනුන් පිළිගත ද, එක්සත් ජනපද රාජ්‍යය හැම අතින් මැ සපුරා දන්නා කිසිවෙක් නො වෙති. මා වැනි විජාතිකයකු වුව ද, තමන් ගේ අත්-දැකුම් කිහිපය පොදු ලකුණු සේ සලකා තම සිතැඟි ගෙනැ හැරැ පෑමට ගන්නා තැත කැමියැ හැකිමැ යි. එ බැවින් මෙන්න එය:—

තියුණු නැණින් යුත් ඇමෙරිකා වැස්සෝ හැම විටැ මැ පාහේ තැනීමට වඩා විකිණීමට සිත් යොමු කරන්නෝ වෙත්. තැනීම සාමාන්‍යයෙන් හඳුන්වන්නේ 'නිපැයුම' යන්නෙනි. ගනුවන් රිසි මැනැවින් හඳුනා-ගෙනැ ඒ අනුවැ සැලැස්ම ද ද්‍රව්‍ය ද නිසි පිළිවෙළට සංවිධානය කැරුම 'නිපැයුම' යන්නෙන් ගැනේ. ගනුවන් ගේ සිතැඟි හා ඕනෑ-එපා-කම් හා ආදියෙහි පෙරැ-දැනුම් අලෙවිකුරු දහමේ වැදගත් සලකුණෙකි. නිපැයුම් කළමනාකරුවන් ගත යුතු මහ පහදන්නේ අලෙවිකුරුවන් ගේ උපදෙස් මැ යැ. එ බැවින්, මත්තේ දී උනට විනකුරු වුව ද, ඇමෙරිකා ජනයා හට උන් පැතූ දෑ සිතූ අයුරින් මැ ලැබේ.

අපි කාරයක් දෙස බලමු. මේ රටෙහි, කාරයක් හිමි වීම තමන් ගේ ඉහළ-කම ලොකු-කම මැනෙනා මිම්මක් බැවින්, පසිඳු ඇමෙරිකා වැස්සෝ එක් එක් අවුරුද්දේ එක් එක් කාරය බැගින් මිල දී ගනිති. සමහර විටැ කාර දෙකෙකැ හෝ තුනෙකැ හෝ හිමියෝ ද වෙත් මැ යි. කරුණු මෙ සේ හෙයින් කාරයෙහි දිගු කල් පැවැත්මෙක් නුවුවමනා යි. වුවමනා වනුයේ පිට ඔපයත් මඳ කල් පැවැත්මත් නොමනා දිගත් පමණි. ලෝස් ඇන්ගිලීස් පෙදෙසෙහි පමණක් ඇති කාර ගණන මුළු මහත් යුරෝපාක්රයේ ඇති කාර ගණන පරදවයි. අඩුවකට ඇත්තේ, මඳ දුරක් වුව ද පයින් ගමන් කළ වගක් වත් මතක ඇතියන් ගේ ගණන පමණි.

එ බැවින්, කවි තැනුම ද මේ ඇමෙරිකා 'අලෙවි-නිපැයුම්' ක්‍රමයට වැටී අසු වී සිටුනා මා නො විස්මවයි. කවි තැනුමට වඩා කවි නිපැයුමට කිවියන් උනන්දු වන වගට, වැදගත් පොතෙහි ද, ඉහළ පෙළේ කුඩා සඟනුවලැ ද, දූන් දූන් පහළ වන කවි මැ දෙස් දෙයි. හැදියාවක් නැති ජන රැසක් ලෙසින් ඇමෙරිකා වැසියන් හෙළා දක්මෙක් මින් නො කැරෙයි. ඇමෙරිකාව දෙස බැලූ කලැ, පාසල් ඇසුර ලත් අය ගේ ගණන මහ බ්රිතානියයේ එ වන් ගණන පරදවන සේ පෙනෙයි.

මහ බ්රිතානියේ සරසවිවලට වඩා ඇමෙරිකා සරසවි බෙහෙවින් සපිරි වැ පැවැතෙන්නෝ යි. එහි, ගුරුනට ලැබෙන වැටුප මහත් යැ. වාද විවාද යුහුසුලු වැ කැරෙයි; සතර කෙරෙහි උනන්දුව මහති; පොත්ගුල් පොතින් පිරුණේ යි. එහෙත්, පාසල් දිවිය කෙටි යැ, සොබාහුරු නැති. පාසලින් වියෝ වුණු වහා සතර උනන්-දුව නැසෙයි. හැදියානු සිනිවිල්ලෙන් මිදෙයි;

එකිනෙකා කුළල් කා-ගෙනැ හෝ 'අලෙවි-නිපැයුම්' දහමෙහි ඇලී-ගැලී තම දිවි පෙවෙත රැක්මෙහි නියුතු වෙති, ඔවුහු.

චෝස, ස්පැන්සෙ, මාලෝ, ෂේක්ස්පිය, ඩන් ආදි පසුගිය සිය වසෙහි කිවියන් ගේ කුලවත් කිවියාවට, පාසලේ දී ඉංගිරිසි ලිවිසැරිය හදරන සිසුවා මුහුණ දෙයි. එහෙත්, ඔහු ඒ ආරේ පිහිටා ලියුවහොත් ඒ පැබැඳුම යටගිය සිය වසෙහි මිසැ දැන් නම් අලෙවි නො වෙයි; යට ගියාව පසිඳු කැරෙන මාදිළියක් සේ හැඟී යෙයි ඒ පැබැඳුම. එ බැවින් ඔහු ගේ උනන්දුව ලක් වන්නේ **හොප්කින්ස්, යේට්ස්, එලියට්, පවුන්ඩ්, ඔඩන්, ඩිලන් තෝමස්, ඉඩිත් සිට්වෙල්** ආදි නූතන කිවියන් කිවිවියන් දෙසට යි.

මේ නූතන කිවියන්, සදහට මැ නූතන කිවියන් සේ නොගැනෙන වග හෙතෙම නිතැතින් දන්නේ යි. එ සේ නම් ඒ නූතන කිවියනට පසු වැ එන්නේ කවරේ ද? ''නූතන කිවියන් යල් පිනූ විටැ ඉක්බිති වැ එනුයේ මා වැනියන් වියැ නොහැකි ද? යන්න සිසුවා සිත්හි නිතරැ නිතරැ නැගෙයි, කිවියකු වන්නට අදිටන් කැරැ-ගත් පසු පාසලෙහි තම අවසන් අවුරුද්දේ දී පාසල් සඟනුවෙහි තම පැබැඳුම් කිහිපයක් පළ කැරැවූවා නොවැ? ඉදින්, ගනුවා ගේ රිසි සොයා බලා දැනැ, ඒ අනුවැ මා හැඩ ගැසී අවසරය ලද කෙණෙහි 'අලෙවි—නිපැයුම්' මඟෙහි යෙදියැ යුතු යැ යි හෙතෙම සිතට ගනී.

බොහෝ විටැ තම පාසල් මිතුරනට ඉඟියෙන් බිඟියෙන් අඟවයි මත්තට එන මහ කිවියා තමා බව. **හොප්කින්ස් යේට්ස්, එලියට්, පවුන්ඩ්, ඔඩන්, ඩිලන්, තෝමස්, ඉඩිත් සිට්වෙල්** යන්නන් ගේ ආර එකට හනා සියුම් ලෙස නිමැවූ අච්චාරු ආරක් අනුවැ, වියවුල් මැයක් යටතේ ලියැවුණු කව් පබඳක් මොනොවට මුද්‍රණය කැරැ පළ කරයි. ඉක්බිති වැ ශිෂ්‍යත්වයක් ද ලැබැ-ගෙනැ යුරෝපාකරයේ සවාරියෙකැ යෙදෙයි. මා ගේ මහත් තත්ත්වය දක්වනවා යැ යි නො-සිතන්නැ, සැබැව නම් කිවියාව රැකියාවක් කැරැගත් ගණයට අයත් මෙ වන් කිවියන් මා ගේ උදව්වත් උපදෙසුත් පැතූ, පතන වාර ගණන් නැති. එසේ මා කරා එන්නේ මන්ද යි මගෙන් නො අසන්නැ. ඔවුන් පෙරැ දක්වූ යම් මැ කිවියාවෙක් වේ ද එය ඉක්මැ-වීමට ඔහු අපොහොසත් වෙති, යුරෝපා-කරයේ සවාරියෙක යෙදුණ ද.

කිවියාව වෘත්තියක් ලෙස තැකීම එකෙකි; එහෙත් එය රැකියාවක් ලෙස තැකුම එයට ඉඳුරා වෙනස් වූවෙකි. යටත් පිරිසෙයින්, දිය-සායමට අත නුහුරු වුව ද පියානාව වැයුම නොහැකි වුව ද තමන් තුළැ මහ කලා හැකියාවක් ඇතැ යි සිතන්නන් කෙතෙක් සිත්කලු අය වුව ද මම උන් නො තකමි. එ වන් අය මා ගේ උදවු-උපකාර පතන්නට වෙහෙසෙන කලැ මා උනට මතක් කැරැ-දෙන්නේ, කිවියන් සේ ගිණියැ හැකි අය දෙ තුන් දෙනකුට වඩා එක් මැ සමයේ කිසි දු විටෙකැ පහළ නුවූ වග යි.

එ බැවින් ඔවුන් ගේ කිවි බව පැතුම, නොබෙල් තෑග්ග ලබා-ගැන්මට හෝ ලෝ රූමතිය සෙයින් තේරෙන්නට හෝ යන්න දුරුම වැනි යැ. ඔවුන් පැහැද-වීම ද මා අතින් කැරෙන්නේ මැ යි. මේ 'කිවියා-වෙළෙඳුන්' මා කිසි විටෙකැ ගණනට ගන්නේ නැති. එ වන් 'කිවියා-වෙළෙඳුන්' බලහත්කාර කමින් පසිඳු වූවා පමණක් නො වැ විචිසුවන් ලවා ඔවුන් මහ කිවියන් ලෙස හඳුන්වාගත් තැන් මා ගේ රටෙහිත් එමට යැ. මා ළදරු වියෙහි දී **ඔබරි** ද විය, **චම්ලි පෙනල්** යන අය ද, මා තුරුණු කලැ දී **එඩමන් ගුස්, විලියම් වොට්සන්, රිචඩ් ලා ගැලෙන්** යන අය ද පසු වැ **ගෝඩන් බොටම්ලි, විල්ෆ්‍රඩ් ගිබ්සන්, එඩ්වඩ් ෂැන්ක්ස්, ජෝන් ෆ්‍රීමන්, හම්බට්**

වුල්ෆ්, යන අය ද, එයටත් පසු වැ.........හා මෙ වට්වෝරුව කුමට දික් කරම් ද? ඔබ හැම අතුරින් විය පත් අය තමන් ගේ මතකය ඇළැලුවා නම්, පළමු නිකුතුව බෙහෙවින් අලෙවි වුණ.ද දූන් කමකට නැති සේ වැතිරැ හොවිනා පබඳ බිහි කළා වූ නුදුරු අතීත-යෙහි වන් ඇමෙරිකා කව් විරුවන් විරුවියන් ගේ දිගු නම් ඉද්දක් පහසුවෙන් සකසා-ගත හැකි යි.

පසිඳු වන්නට තතනන 'කිවියා-වෙළෙ-ඳුනට' ගනුවන් රිසි දූනැ - හැඳිනැගැන්ම ඇවැසි යැ. දූන් දූන්, සරසවියේ ඇත්තේ "ඉංගිරිසි ලිවිසැරි අංසය" වෙනුවට 'නිර්-මාණාත්මක ලේඛක කලා අංශය' යන්නෙකි. පන්නය වෙනස් වත් මැ කිවියාව ද ඒ අනුවැ හැඩ ගසා-ගත යුතු වෙයි. යොදන විරිත, මැය තෝරා-ගැන්ම, ඌරුව යන දැ පන්නය අනුවැ වෙනස් කළ යුතු වේ මැ යි.

ජයට රුවට හැඳැ-පළඳින ගැහැනුනට ද මෙ වන් ගැහැට විඳුමට සිදු වෙයි. ඇඳුම් පැළැඳුම කො තරම් අයසකුරු වුවත් කො තරම් විසුළු ලෙසක් පැවත් පන්නයට ගැළැපේ නම් මහ සොම්නසින් යුතු වැ හැඳැ-පැළැඳැ ගනිති ගැහැනු. තම මුහුණු කොළ පාට සායමින් තවරන්නට හෝ ඉස්සන් අමුණා තැනුණු මාලයක් ගෙලැ ලන්නට හෝ ඉරි යෙදූ සිමෙන්ති මලු පළඳින්නට හෝ එක් සැණින් නැමෙති ගැහැනු. එ වන් ගැහැනුන් පවා කිසි කලෙකැ නොකරන යම් යම් දැ වේ මැ යි. තම මුහුණ උඩු-රවුළින් හා යටි රවුළින් හා සැරැසුම ආදි දැ කිසි විටෙකැ දු නොකරන්නෝ යි.

එහෙත්, මේ අප ගේ කිවියනට එ තරම් වත් හිරියෙක්-කිතියෙක් ද නැති; ගැහැනුන් දක්වන තරමේ තැන්පත් බවකට ඔහු උරුම නො වෙති. සරල අරුත කෙරෙහි දක්වියැ යුතු ඇල්මෙන් ද පවා මිදුණෝ යැ ඔහු. මෙ තෙක් කිවියන් ගත් මහ නම් සැහැවි අරුත් සේ පද බැඳුම යි. එහෙත්, මේ අප ගේ කිවියන් ගන්නා මහ නම්, අරුතක් නැති වුව ද කම් නැති සේ සැලැකීම යි. කියවන්නා ගේ මනස අවුල්-වියවුල් වන සේ අරුත් විරහිත වුව ද ගැඹුරු අරුත් ඇති සේ ඉඟි පානා පද-වැළක් ගෙනැ හැරැ-පා කියවන්නා ගේ නහර දුබල බවකට පෙරළීම යැ නව කිවියන් ගන්නා මහ නම්.

මෙය ඉතා සියුම් කිරියා මඟෙකි. එක් මාදිළියෙකැ උමතුවෝ කලකිරුණු සොබා වක් දක්වති. උනට විදිලිය පහරක් දී උන් දිරි බිඳැ වෙදණන් ගේ අණ සකට යට කැරැ-ගැන්ම ලෝ පිළිගත් වෙද කමෙකි. කව් කියවන්නන් ද උමතු ගණයේ ලා, ඉහතැ දක්වූ පන්නයේ පැබැඳුමෙන් පහර දී උන් දිරි බිඳැ කිවියන් ගේ අණ සකට ඔහු යටත් කැරෙති. මේ යැ නූතන කිවියන් ගේ අරමුණ. කිවියන් ගේ පරම අදහස කව් අලෙවිය මිසැ කව් නැනුම නොවන හෙයින්, ජන සමාජය මනස් රොවින් පෙළෙන පොහො-සතුන් ගෙන් පිරී ඇති හෙයින්, මෙ වන් පිළිවෙතෙකැ පිහිටා කව් නිපැයුම කෙසේ නම් අරුමයෙක් ද?

මා ගේ හැඟුම නම් අලෙවිය උදෙසා ලියැ-වෙන්නක් නො වියැ යුතු යැ කවිය. කිවියා කෙරෙහි ගැප් වූ තැනැති පෙලැඹීමෙකැ පල විසින් බිහි වන්නෙකි කවිය. මුතු බෙල්ලා මුතු තනන්නා සේ කවියා ද කව් තනයි, කො තෙකුත් තනයි. රසවත් ලෙස, පණවත් ලෙස ඔදවත් ලෙස ගැදියෙන් පැ නොහැකි කලැ පැදි මඟ පාද-ගත යුතු වෙයි. එ විටැ කිවියා කවියෙන් මැ කියයි; මහ දනා බලහත්කාරයෙන් නම්මා ගෙනැ පැසැසුම් ලැබැ-ගැන්ම ඔහු ගේ අරමුණ නො වෙයි. මහ දනා ඇති වගකුදු හේ නො තකයි.

සරසවි දේවිය ලෙස හැඳින්විමෙහි මා කැමැති, කිවියා ගේ සිතෙහි මුරකරු සේ

සැලැකියැ හැකි, විස්මකුරු බල වේගය කිවියාට පැනයක් පෑ විටැ, හේ එය විසැඳුමෙහි නිරත වෙයි. එ විටැ කවියෙක් මැවෙයි. එය එ සේ මැ ලොවට දෙයි කිවියා. කිසිවකු ගේ සිත කිහිරි ගැසුණ ද, කිසිවකු ගේ සිත සොම්නසින් ඉපිලැ-ගිය ද ඔහුට කම් නැති. තම කිවටු ඇසුර ලබන හිත–මිතුරන් කිහිප දෙනකු එ මැ කව අනුදත හොත් ඒ ඕහුට පමණි.

ඇමෙරිකාවෙ 'නවයෝක' සරසවියෙහි දී රොබට් ග්රේව්ස් කළ දෙසුමක් ඇසුරෙනි.*

*　　*　　*　　*

මහ වැලි ගඟෙහි මහ　—　වතුරු නැඟී මඩුත්'වුරු
කෙ ගරහා එය නවතත්　—　කෙ දියුණු කෙරෙත් පසසා?
ගැරැහුම් ඔබනට ද　—　පැසැසුම් ලබනට ද නො වැ,
වතුරු නැහැ ගඟ ගලනෝ'ව්　—　සුකිවි බස බැසැ රස දේ.
කුමට රද සහරා　—　කුමට නුනුවණ දනා පුද,
කවියෙන් රස දතෙ'කකු දූ　—　කුල්මත් කරත හැකි නම්?

—කුමරතුඟු මුනිදස්

පැදි තරග පල

මැය – දිනක් හිරු නො පායා වූ මහ අවුල

මුල් තැන – කුලියාපිටියේ රවීන්ද්‍ර තෙන්නකෝන්

සමත් තැන – අක්කරපත්තුවේ චන්ද්‍රරතන හිමි
පහළ කීඹියේ, අ. පොන්නම්පෙරුම

පැදි තරගය (දිනූ පබඳ)

දිනක් හිරු නො පායා වූ මහ අවුල

කුළියාපිටියේ
රවීන්ද්‍ර තෙන්නකෝන්

දිනිඳු පැමිණි පුවත
ලොවට පවසන හැම ද
සැවුල් අණ බෙර කරු ගේ
හඬ .හා! නො ඇසේ මෙ ද.

හැම ද සිරිත ලෙස
රැයින් පිබිදුණු ගැමි ලිය
'හා! තව මහ රැ නොවැ!' යි
කුහුලින් වට පිට බැලූ.

සුව පහස් දෙන කොඳු
පලස' තුළ නිදි යහනේ
පුර අහන රැය දිග වැඩි
බලා වූවා තොස වැඩි.

කංකානියා නැති
වත්තේ වැඩ අඩුයෙනුදු
කැරුණක් ලොවැ අදියුරා
නැති අද වැඩ කැලම නැති.

වතුරු නොමැති කලට
ගං හෝ ගමත් නැති සේ
'ඉරු එළි නැති ලොවැ අඳුරු
බැරි යැ යි පාසල් ගමන්'

සිසු දරුවෝ හොවිති
තව තව තුදු වැ යහනේ
රිවි දෙවියන් අප යැදුම
අසා අද නො පැමිණෙති යි.

තළාවලැ සියපත
සිය නෑ පිය මිතුරු වූ
සහසකර මෙ පමණ කල්
තමා දකුමට නායේ—

හැයි දෑ යි සියුමාර
මව ගෙන් අසා වැලැපෙන
ලෙස කොමළ මුව හකුළා
දුක්මුසු වී නමයි හිස.

බිඟු මෙමෙහෙසුන් වටා
සිටැ මිහිලොල් රළ මෙ මහ
පුදුමය ගැන අසන්නෝ
තව ම ගෙහි නද දෙන්නෝ—

රිවි නෑ පියුම් වත්
සිපැ රොන් ගත් හෙයින් වත්
හිරු අඩුවම් පමුණුවත්
දෑ යි නුවූ සැකයෙනි' වත්.

හැම දිනැ දිනන දිනි'—
සුරු අද තරු සෙනඟ ගෙනැ
ආ සොමි නරිඳු නිරිඳුට
පරදිනි යි කොඳ මෙහෙසිය—

විල් නිල් මැඳුරුවලැ
දිය දද බඳින තරිඳුට
තොස පවනේ හිස නගා
පෙති දත් සිරි පෑ රඟා.

කොවින් තමා දෑවූ
ඉසුරු දළ නෙත වන් ඉරු
නැති වැ වැඩි පුරු මල් සර
ලලා තුස් වේ මල්සර.

අඳුරු මහ දූගුණැ
සරන වවුලු බකුසු කැල
තොස් වෙත් ඉතින් නැති යැ යි
හෙළි ගුණයට තැනක් ලොවැ.

ගියෙන් කත් රුවිනැ'ස්
පිනවා ලොවට තොස දෙන
දද කැන් හිරුට දද කැන්
නො බැඳැ වළඳති නිඳි කැන්.

කුරුලු නළුවෝ සිය
ගී රැඟිය පටනට හිරු
අදියුරා එළි රහ බීම
නොසඳනු කිමැ යි සැකයේ.

* * *

රිවි දෙවියන් හේළි
වැඩට මැ නිති වෙහෙස වී
මෙ කපට එක ම දවසක්
ඉසිඹු ගැන්මෙනි මෙ අවුල.

සත් නමු වහර

අරිසෙන් අහුබුදු

"**බල්ලුකයා** ගේ කටට මැ හිය යැවූ **පුස්සදේවට ගැමුණුවෝ** මසුරන් රැසක් දුන් හ.,

කළු අකුරින් මෙහි යොද ඇති පද යළි පෙළ ගස්සමු.

බල්ලුකයා ගේ

පුස්සදේවට

ගැමුණුවෝ

මින් මුල් දෙ නම එක් බස් යැ;
තෙවැන්න බුහු බස් යැ.

මුල් දෙ නම යළි විමසන්නැ.
බල්ලුකයා, පුස්සදේව යනුයෙන් ඒ දෙ නම ගෙනැ දෙකෙහි කිසි යම් වෙනසෙක් වේ දැ යි බලන්නැ.

බල්ලුකයා — මේ නිගරු පිණිසැ එ නම යෙදූ සැටි යි.

පුස්සදේවට — මෙ ද පුස්සදේවයාට යැ යි යෙදියැ හැකි වැ තිබිණ. එහෙත් අර දෙමළා ගේ තතුවට — නිගරුවට — එ නම වැටෙනු නොහිසියෙන් එ සේ නො යෙදිණ.

පුස්සදේවයනට හෝ පුස්සදේවයන් හට යැ යි ද යොදනු ද හැකි වෙයි එ නම. එහෙත් එ වැකියේ මැ එන ගැමුණුවෝ යන නම තරමට මැ ගරුවක් නො දියැ යුතු හෙයින් එ සේ ද නො යෙදිණ.

මේ සැමැනි වහර යි.

ගැමුණුවෝ යන තන්හි එනුයේ කවර වහර ද?

ගරු වහර යි.

මේ තෙ නම් වහරට පිහිට සඳහා දැක්වුණු එ වැකියෙහි එන "පුස්සදේවට යන පදය නිවැරැදි දැ යි ඇතැමකුට සැක සිතෙනු වියැ හැකි: එ සේ නම් ගුණපාලට, විමල්ට, අල්ලිස්ට ඈ සේ මැ ගොන්ට, බළල්ට, සිංහට ඈත්ට නිවැරැදි වියැ යුතු යැ යි ද ඔවුනට සිතෙනු වියැ හැකි.

මේ යැ විසැඳුම:-

ගොන්, බළල්, සිංහ ඈ, දැ නමු හෙවත් ජාති නාම යැ. ගුණපාල, විමල්, අල්ලිස් ඈ සත්නමු හෙවත් සංඥා නාම යි.

සත් නමු හෙවත් සංඥා නාම එ කී අයුරු යෙදුම ජන වහරෙහි බෙහෙවින් එන්නෙකි.

නිද:- **සිරිසේනට** මේ පොත දෙන්නැ,
නිමල් ගේ අත කැපුණා.

එහෙත්,
බළල්ට බත් දීපන්,
කොටි ගේ ඇහේ පුල්ලි හුඟ යි,
ඈ විසින් දැ නමු පියෙවිවලට මැ, පස (ප්‍රත්‍යය) ගැන්වීම වහරෙහි නො එන්නෙකි.

මෙයට හෙය කිම?

පිළිතුර මේ යැ.

සත් නමු (සංඥා නම්) පියෙවි නො වේ.

පියෙවියෙක් නම් එක් බස්, දෙ බස් දෙකට මැ පොදු වියැ යුතු යි.

නිද: **ගොන්** තණ මැ **නැඟී** යැ.
ගොන් තණ මැ **නැඟු** හ.

එහෙන් සත් නමුව—ගරු, නිගරු පස නො යෙදූ සත් නමුව — හුදු එක් බස් යැ.

'ගොන් බින්ද වැට' යැ යි කිව, ගොන් යනු පියෙවියක් හෙයින් එක් බස් ද, දෙ බස් දැ යි සැක උපදී. එහෙත් 'විමල් කළ වැඩ' කී කලැ විමල් යන සත් නමුව, පියෙවියක් නොවන හෙයින් එක් බස් මැ යැ.

සත් නමු, පියෙවි නො වෙති යි කීයේ මේ නිසයි. එ හෙයින් පුස්සදේවට යනු

ගොන්ට, බලල් ට ඈ නියරින් මනිනු වරදෙකි.

පැරණි පත–පොතින් මේ තෙ නම් වහරට නිදසුන් විමසමු.

'**මුගලන්** හට ජය යැ; **නඤයා** හට පරාජය යැ.'

'නාළාගිරි **ධනපාල** නම් වී.''

'බුද්හු **ධනපාලයා** පන්සිල් පිහිටවූ හු. (අමාවතුර)

සාමාවතින් ගේ බුජ්ජුත්තරා නම් දසියක්.........'

'**සාමාවතී** ප්‍රීතින් පිනා – ගොසින් කිව එ තෙපුල් අසා **බුජ්ජුත්තරාවෝ** . ...', (සදහම් රුවන්වැළ)

'ඉදින් **සේනකයෝ** අනෙක් උත්තරයක් කිවූ නම්...'

'**සේනකයාන්** කොටුවෙහි පටවා තුබූ වී කා නිමවා කොටු පත්ල අත ගා—පියා...'

'...**සේනක** යැ, පුක්කුස යැ, කාවින්ද යැ, දේවින්ද යැ යන...'

(උමංදව)

මෙහි නිගරු වහර යි සැලැකුණු නියරත් සැමැනි වහර යි සැලැකැවුණු නියරත් දෙක මැ පැරණි සමයෙකැ මෙහි ගරු වහරේ නියර ලෙස ද පැවැති බවට දෙස් අපේ පත - පොතින් නොලැබෙන්නේ නො වේ.

'**රටපල,** මේ නන්දෝපනන්ද නම් නාග රාජ තොපට දැහැවී යැ.'

'**මුගලන,** සිහි එළවා.'

'**අනඳ,** පහ වැ යා'

'**සැරියුත,** බුදු බල තොරැ'

(අමාවතුර)

'දූන් සදහම් රජ කරන්නේ **ගොයුමා**'.

'**දිවකුරු** මුනි යමා ඉදුහ කෙළේ'

මායා තුසී පුරෙහි වූසූ'.

(සිදත්සඟරා)

වත්මන් වහරෙහි ද වැඩි ඇල්ම නිසා මා–පියන්, ගුරුන්, යාළුවන්, ඈ, අය සිය දරුවන්, සිසුන්, යහළුවන් අර පැරණි හෙළ නියරෙහි පිහිටා අදත් අමතනු පෙනේ, පරසිදු අය සඳැහීමේ නියර ද මේ වූ සේ යැ.

එහෙත් පොදු නියරක් හැටියට සලකන විටැ මේ තෙ නම් වහර, වහරෙහි ඉඩ ලබන සේ පෙනේ.

මේ තෙ නම් වහර, අද බස් වහරේ යෙදෙන සැටි මෙ සේ විමසා බලන්නැ.

1. **නිගරු**

   උක්ත: **සිරිසේනයා** මෙහෙ කරයි.
   සිරිසේනයාලා මෙහෙ කරති,

2. **සැමැනි**

   උක්ත: **සිරිසේන** ගෙදර යයි
   සිරිසේනලා ගෙදර යති.

3. **ගරු**

   උක්ත: **සිරිසේනයෝ** රට රකිති.

1. **නිගරු**

   අනුක්ත: පොලිසිය **සිරිසේනයා** සොයයි.
   පොලීසිය **සිරිසේනයාලා** සොයයි.

2. **සැමැනි**

   අනුක්ත: ගුරුතුමා **සිරිසේන** අමතයි.
   ගුරුතුමා **සිරිසේනලා** අමතයි.

3. **ගරු**:

   අනුක්ත: වැසියෝ **සිරිසේනයන්** සමරිති.

— එළිය (1959. 1.)

පැදි විචිනුව

චන්ද්‍රරත්න මානවසිංහ ගේ "වෙසක් මිහිර"

තුවන්සිරි ජයකුරු

වෙසක් යන වදන ඇසෙත අප මනැස යොමු වනුයේ බුදු රදුන් හා බැඳුණු තෙ මඟුලට යි. එ කලට සබා දහම ද අමුතු සැරසිල්ලකට සැදෙයි. මෙය වඩාත් අමුතු ඇසෙකින් චන්ද්‍රරත්න මානවසිංහ දකී. ඔහු විසින් ලියැවුණු "වෙසක් මිහිර" නමැති මේ කව් පෙළ ඒ දැක්ම අප ද දක්වයි. "නවීන පද්‍ය රචනයේ" ඇති මෙ කව් පෙළෙහි වෙසක් මසේ ඇති වන අමුත්ත දැක්විමට තිවියා ගත්තේ මවක හා දරුවකු හා අතරැ ඇති වූ දෙ බසෙකි.

"මොනව ද අම්මේ අකුරු ජාතියක්
මල් පෙතිවල කවුදෝ ලියලා
කවුරු ද අම්මේ මේව ලියන්නේ
පාට පාට ඉරි හැඩ ගහලා"

මෙ සේ යැ කව් පෙළ ඇරැඹෙනුයේ. එ නම්, අවට පරිසරය පිළිබැඳි වැ දරුවා නඟන පැනයෙකිනි. මව ගේ පිළිතුරු කිම?. එ බඳු කාලවලට බෝසත්වරුන් දෙසන බණ කතා අසා වන දෙවහනන් මල්වලැ ඒ ලියන බව යැ. මෙහි බණ නම් බුදු බණ යි. බණ වඩ–වඩා කියැ-වෙන්නේ වෙසක් සමයෙහි යැ. ඒ බණ කියන්නන් අතරැ බෝසත්හු ද වෙති. වන දෙවහනන් මල් පෙතිවලැ ලියන්නේ ඒ බෝසතුන් කියන බණ යැ. මෙහි බෝසතුන් මැ කියන බණ යැ යි කීමෙන් හැඟෙනුයේ කදිම ධ්වනියෙකි. බණෙහි ඇති උසස් බව එක් හැඟැවීමෙකි. අනෙක නම් අද බොහෝ වහන්දෑ මුවින් බණ නමින් පිට වන සියල්ල බුදු බණ මැ ද යන්න පිළිබඳ ඉඟියෙකි.

වෙසක් මසැ සෙසු මස්හි නොලැබෙන තරම් මල් සුලබ බව සොබා දහම්. එහෙත් මානවසිංහ එය දකින්නේ ඒ මසේ වන දෙවහනන් බුදු බණ ලියන්නට මල් ගන්නා නිසා ඒ වැඩි වූ සැටියෙකි. බණ ලියන්නට මල් මැ ගන්නා බව කීමෙන් තිවියා මෙ පැදියෙන් තෙ වන ධ්වනියක් ද නංවයි. එ නම් බෝසතුන් කියන ඒ බුදු බණෙහි ගරුව යි. බණ දෙවියන් අතරැ දු පැතුරුණු නියාව පැමෙන් බුදු බණෙහි උසස් තතුවත් බුදුන් ගේ මහිමයත් පිළිබඳ වැ සිවු වැනි ඇඟැවීමෙක් ද ලැබේ. විතක් තියා මෙසේ හුහක් ඇඟැවීමෙහි ලා මානවසිංහ ලබා ඇති උසස් කිවි කුසලතාව පිළිබිඹු වන මෙ බඳු තැන් කිහිපයෙකි මෙ පැදි පෙළෙහි.

මල් පැහැ, ගැන්වෙන්නේ කෙ සේ ද? ඉර පායන විටැත් ඉර බැසැ යන විටැත් ඇති වලාකුළුවලිනි. එ සේ කීමෙන් සිය සිහිති දරුවාට අමුතු කතාවක් තියා ඔහු සනසන මවක් අපට මෙහි දී මැවේ. ඒ අතරැ මැ උදයට නැඟෙන හිර සවසට බැසැ යන කලැ එක සමාන තතුවක් ඇති වන බව මෙයින් සිහි වේ. මිනිසා උපදින විටැත් මැරෙන විටැත් ඇති වන තතුව පිළිබඳ වැ හෝ ඔහු ගේ බිලිඳු වියත් මහලු වියත් යා කරන සම බවක් පිළිබඳ වැ හෝ නන'යුරු සිතිවිලි ලොවකට ද කියවන්නා මෙයින් පිවිසෙනු ඇති.

වෙසක් මසැ කුරුල්ලෝ ද ඔකඳ වැ කෙළිති. එහෙත් එ ද මානවසිංහ දකින්නේ වෙසක් මසට මැ අයත් කරුණක් සැටියෙනි. බෝසත්වරුන් ගේ බණ කතා වන දෙවහනන් විසින් ලියැවුණේ මල්වලැ යැ. එහෙත් කුරුල්ලන් ගැයූ බුදු ගුණ ගී ලියැවුණේ මල් කොළවලැ යැ.

ඉක්බිති වැ දැක්වෙන්නේ සබා දහම ද අමුතු වෙස් ගත් සැටි යැ. උඩත් බිමැත් දෙකෙහි මැ මල් යැ. මල් පිපී ඇති අතරැ සමහර මල් ගිලිහී බිමැ වැටී ඇති බව යූ සේ යි. එ පමණෙකැ ?. මල් සහ කුරුල්ලන් වෙන කලට එ සේ නැත්තේ ඇයි දැ යි දරුවා අසයි. එයින් අපට මතක් වනුයේ මේ සොබාව වෙසක් සමයට මැ වෙසෙස් වන බව යැ. එයින් ලොවැඇති සිරිය සඳ එක සේ නො පැවැති නැසෙනසුලු බව ද කියැවේ. මෙ ද වෙසක් මසැ බුදුන් පසක් කළ දහමට මැ අයත් අනිස බව පිළිබඳ දහම් තාවෙකි.

එ කියමන තවත් දුරට තහවුරු වන්නේ මව ගේ පිළිතුරෙනි. එ නම් බුදුන් ඉපැදුණු කාලෙට මිනිසුන්, සතුන් හා ගස් කොළන් යන සියලු කොටස්වලට මැ සතුට ඇති වන බව යැ. බුදුන් පිරිනිවි වස් දහස් ගණන් ගෙවුණු කලෙකැ පවා තතු එ සේ නම් එ ද මෙ බඳු මැ සමයෙකැ තිලොවට මැ බුදු රදුන් ගෙනැ දුන් සෙත ගැනැ කවර කතා ද යන්නත් මින් මැ හැඟැවේ.

අන්තිම කවි දෙ පදයෙන් කුඩා දරුවා කියන්නේ බුදුන් වහන්සේ සිනැහෙන බවෙකි. බුදු රුවේ ඇති අනුපම සොමී බව සිහිති ඇසට පෙනුණු සැටි දැක්වූ අයුරු ළ-ගන්නාසුලු යැ.

"අම්මේ! අර අපි සාදු කියන කොට
බුදු හාමුදුරුවො මල් දැකලා
දුටුවද ටික ටික හිනැහෙන ලස්සන
ඉස්සර කිව බණ මතක් වෙලා"

බුදු පිළිමයෙහි පහන් මුහුණ සිනා නඟන ලෙසෙකි ළමා ඇසට පෙනුණේ. කුඩා වුව ද ළමයින් ගේ සිරිත නම් තමන් ගේ තීරණවලට තමන් ගේ ලොවින් මැ හේතු ද සලකාගැන්ම යි. ළමා සිත මැනැවින් හඳුනන කිවියකුට ඒ තතුවට බැසැ ළමා තීරණවලට ළමා හේතු ඇඳගැන්ම එ තරම් කරුණෙක් නො වේ. මානවසිංහ දකින හැටියට බුදු සිනාවට ළමා හේතු තුනෙකි. එ නම් මිනිසුන් දෙන සාදු කාරයත්, තමනට පුදන මල් දැකීමත්, බුදුනට තමන් ඉස්සර කී බණ මතක් වීමත් යන තෙ කරුණ යි.

බැලූ බැල්මට නම් මෙ හේතු තුන මැ ළමා යැ. එ හෙයින් මැ බොළඳ යැ; අහිංසක යැ. එහෙත් හාරා අවුස්සා බලන විටැ නම් මේ කිවියා කවරෙක් ද යනු ඉනුදු එළි වී පෙනෙනු ඇති. අප 'ඔන්න බුදුන් මල්' කියන්නා සේ ලොවේ සොඳුරු සැරැසිලි ගොඩ – ගොඩවල් කඳු මෙන් පිළිම ඉදිරියේ විසුරුවා, හිතින් නො වැ කටින් පමණක්, නඟන්නන් වාලේ නඟන බොල් සාදු කාරයත්, බුදුන් එ ද දෙසූ බණ නමින් අද ඇතැමුන් දෙසන බණත් බලා බුදුනට පවා සිනා ගිය හ යි මින් නො හැඟැවේ නම් පුදුමයෙකි!

බැලූ බැල්මට අප සිත්හි සැඳැහැ උතුරු-වන, සසර අසර සිහි කරවා සිත බවුනට යොමවන නුවණ් (ශාන්ත) රසයෙන් පිරි පැදි පෙළක් සේ මේ පෙනෙයි. එහෙත් මෙහි ඇති සැඟි අරුත්, දනු අරුත් ඈ හාරා බලන කලැ නම් බුදුනුවන් වූ අප ගේ ඇතැම් බොළඳ කම් ගැනැ අප මැ අපට සිනා සෙවන හෙයින් හැසි රස ද නො නැඟී නො සිටිනැ යි ද කිව නොහැකි යැ. ළමා ගුණයෙන් නඟන පැන දිහා බලන කලැ මුළු පැදි පෙළෙහි කුහුලුරු (කුතුහල) රසත් මව ගේ ඇතැම් පිළිතුරු නිසා අබුතු (අද්භූත) රසත් මතු වී පෙනෙයි.

මෙහි ඇතැම් තැනෙකැ වියරණ දෙස් දක්නට ලැබේ. එය කිවියා නොදැන්මෙකින් කළ බව සිතියැ නොහැක්කේ ඔහු ගේ අන් රචනා දෙසැ බැලීමෙනි. "කවුදෝ ලියලා", "කවුරු ද මේව ලියන්නේ." "බෝසත්වරු බණ කතා කියද්දී", "සත්තුන්", "බුදු හාමුදුරුවො මල් දැකලා ටික ටික හිනැහෙන ලස්සන දුටුවද" යනු එ බඳු තැන් කිහිපයෙකි. ඔහු අතින් මේ දෙස් සිදු වන්නට ඇත්තේ කුඩාවුන් සඳහා ලියැවුණු රචනාවෙකැ වියරණය එ තරම් තදින් නො සැලැකියැ යුතු යැ යන හැඟීම නිසා වත් දැ යි නො දනුමු. එහෙත් ඒ වියරණ දෙස් මඟ හැරැවීමෙන් කව් පෙළේ රසයට හානියක් නොවන බව වැටැහෙනු නියති.

මෙ කරුණ අප කිවියා සැලැකුවා නම් ඔහු ගේ රචනයේ වටිනා කම තවත් වැඩි වන්නට ඉඩ තිබිණි.

සිරි නේරු සිරිත

වි. ජ. මු. ලොකුබණ්ඩාර

[දඹදිව අගමැති සිරි නේරුට සිව් සැත්තෑ විය පිරෙනුයේ මේ නොවැම්බර 14 වැනිද යැ.]

"ගේ කිරිගරුඬයක් මෙන් සුපිරිසුදු යැ. අබ මල් රේණුවක් තරම් වත් සැකයක් ඇති කළ නොහැකි තරමට සබවස රකියි. දිරිමත් උදර නායකයෙකි. ඔහු ගේ සෙවණේ ජාතිය යහතින් පවතී"

ගාන්දි එ ද මෙ සේ හඬ නගා කීවේ සිය අග සවුවා ගැනැ යැ; අද දඹදිවැ අගමැති පණ්ඩිත ජවහර්ලාල් නේරු ගැනැ යැ.

දඹදිවට මෙහෙ කිරීමට මැ කැප කළ ඔහු ගේ දිවියේ විය සිව් සැත්තෑ වසරෙකින් පිරෙයි, මේ නොවැම්බර 14 වැනි දට.

එක් දස් අටසිය අසූ නවයේ නොවැම්බර මසැ තුදුස් වැනි ද, අලහබාද්හි මොතිලාල් පණ්ඩිත නේරුතුමාට ද වැ, ස්වරූප් රාණි දේවිය ගේ කුසින් "ජවහර්" බිහි වියැ. හින්දි බසින් "මැණික" යන තේරුම ඇති "ජවහර්" යන නම ඔහුට දුන් මොතිලාල් නේරු සිය දරුවා මිනිස් රුවනක් මැ වනු සිතුවා සිකුරු යි.

එද දඹදිවැ පතළ නීතිවේදියකු වූ මොති–ලාල් නේරු සිය පුතා උගතකු කරනුව, එංගලන්තයට යැවී. තුරුණු කැල්මෙන් ඔද ගැන්වුණු, දුටුවන් මන හදනාසුලු, නේරු තරුණයා සිය හැකියා බෙලෙන්, නමා සිප් සතර හදැරූ තැන, **කේම්බ්‍රිජ්** සරසවිය, පෙර දිගත්, පැළ දිගත් එකට හා කරන පාලමක් බවට පත් කෙළේ යැ.

විසි වියේ දී උපාදියක් ලද හේ, දඹදිවැ සිවිල් සේවාවට ඇතුළු වන්නට ළා බාල වැඩි හෙයින්, සිය පියා ගිය මහ ගොස් මහ නීතිවේදියෙක් වී. පෙරළා සිය රට පැමිණැ, 1916 දී කමලා හා විවාහ වී. විවා දිවියෙන් විසි එක් මසෙකැ ඇවෑමෙන් සුන්දර **ඉන්දිරා** දුව ගේ සුරතල් විකිරි සිනා මුසු මුව දක්නට ලැබිණි.

සුද්දන් ගේ පා පහරින් සිය දෙස් වැසියන් දූඩි සේ පෙළෙන බව, සුද්දන් ගේ යදමින් සිය සොහොයුරු මිනිසුන් කිටි – කිටියේ වෙළී හිඳුනා බව, සුදු සෙබළුන් ගේ කස පහරින් දඹදිවියන් ගේ සිරුරුවලැ වැයිරි සත් මතු වන බව දකැ තෙත් වුණු ඇසින් උණු වුණු ළයින්, එඩිතර සිතින් අදිරද බලයට විරුදු වැ ඉදිරියට මැ ගිය නිසා, සිර ගෙදර සිය ගෙදර කැරැ - ගත් නේරු සතියක් ගෙදරැ ද, දෙ සතියක් සිර ගෙදරැ ද ගෙවමින් ගිහි දිවිය විය කෙළේ යි. ඒ මේ කරදර අස්සේ වුව ද, සිය දුවත් පිය බිරියත් සමඟ හෙළදිවේ ගෙවූ නිවාඩුව, එහිත් නුවරළියේ දී ලද ඉසුඹුව, නම් ජීවිතයේ දී මැ නොලද ආරේ එකක් බව ඔහු සිය සිරිතේ පවසා ඇති.

සියත් හැඟුමෙන් පිරුණු වියත් නේරු සිය රටේ නිදහස් සටන මෙහෙයැවූ ගාන්දි ගේ පිළිවෙත් අකුරට මැ පිළිපදිනා හැටි, දුටු මොතිලාල් නේරු හට ද 1919 වැන්න වන විටැ දී, නිදහස් සටන් බිමට නො බැසැ මැ බැරි වියැ. සියුමැලි ගතින්, මෙළෙක් හදවතින්, මනහර රූසපුවෙන් හෙබුණු කාස්මීර යුවතිය, සිය සෝවිරියන් විඳිනා දුක්බර දිවිය දකැ කම්පා වුණු ළයක් ඇත්තී, හිත දැඩි පිරිමියකු මෙන්, නිදහස් සටන් වනු. 1925 දී කමලා හා සුවිට-සර්ලන්තයට ගිය නේරු 1926 දී මුළු මහත් යුරෝපයේ මැ ඇවිද්දේ යැ. 1937 දී බුරුමයටත්, මලයාවටත් 1938 දී ඉස්පාඤ්ඤයටත් චෙකොස්ලෝවැකියාවටත් ඊජිප්තුවටත් ගිය හේ 1939 දී චීනයටත්, ගියේ. මනහර සුවඳින් යුත් පියකර පෙත්තෙන් සැදුණු කුසුම් කවර දෙසෙකැ පිපුණත්, මිහිරි මැ වන්නා සේ සිරිමත් නැණවත් මිනිසුන් ජාති විසින් හෝ රටවල් ලෙසින් හෝ වෙනස් වෙනස් අයුරින් බෙද වෙන් කැරැ - ලීමට වඩා ඔවුන් ගේ වෙසෙසි හැදියා ලකුණු අගැයීම මැ උසස් කොටැ සැලැකූ නේරු හට මෙ සේ ලොව පුරා මැ ඇවිද නො එක් අයුරේ මිනිසුන් දකැ පුරුදු කම් තුබුණත්, සිය පිය බිරින්දැ තමා හැරැ ගිය විටැ නම් (1926)

ඇඹුණේ යැ. ඒ ඇය තුළැ පතළ දයා ගුණයත් වදන් විසා ඉක්මැ ගිය සිත් අදනා බලයත් නිසා යැ.

සිය දිවියෙන් කැබැල්ලක් නැති වුණා සේ දැනුණු ඔහු එ වක් පටන් ඉතිරි මුළු දිවියෙන් මැ දඹදිව් තලය පර සතුරු උවදුරු වදුරින් බේරාගන්නා මහ සටනට කැප වීමට සිතාගත් සේ වී. ඔහු කුඩා ළමයින් වෙනුයෙන් දැක්වූ ඇල්ම ද එසේ මෙ සේ නො වේ.

ඔහු ගේ උපන් දිනය ළමා දිනය වී ඇත්තේ යැ. නොවැම්බර මාසයේ තුදුස් වැනි දට දඹදිවැ කුමරකුමරියන් සොම්නස් බර සිනායෙන් පිරුණු මුවින්, නො එක් කිළිණයන් පුදමින් සිය දෙසේ අගමැති-වරයා හට ආසිරි පැතිම දූන් දඹදිවැ පතළ පුරුද්ද යැ. දඹදිවැ ළමයින් හට මෙන් මැ ලොවේ සියලු කුමරකුමරියනට එක් වන් ළෙන්ගතු කමක් දක්වන මෙ තුමා 1949 දී ජපානයේ ළමයින් වගයක් දඹදිවැ ඇතකු ඉල්ලා තමනට ලිපියක් එවූ විටැ පිළිතුරු ලෙසින් සැබැවට මැ පණැති ඇත් පැටවකු යැවී යැ. තෝකියෝවේ "ඒනෝ සූ" නම් තිරිසන් උයනේ ඇත් ගාලේ කණුවෙකැ බඳිනු ලැබැ සිටිනා ඉන්දිරා නම් මෙ ඇත් පැටවා, දඹදිවත් ජපානයත් අතර ඇති මිතුරු බැඳුම තවත් තද කෙරෙයි.

නේරු ගේ දෙස් පලු දිවිය, කෙ තරම් කම්-බර වුවත් හේ ඒ කිසිවකුත් නිසා, සිය පත පොතේ වැඩ නම් අමතක නො කරයි. එ ද අහ්මද නාගරයේ සිර ගෙයි සිටිද්දීත් දෙහරාදූන් සිපිරි ගෙයි ඇඳිරි මැඳිරි තුළැ සිටිද්දීත් මෙ ද මුළු මහත් ආසියාවේ නායකයා ලෙසින් දඹදිවැ එක රජය කරද්දීත් මෙ තුමා නම් සිය පතපොත පිළිබඳ කටයුතු අත් නොහළේ යැ. නින්දට යන්නට පෙර භගවද් ගීතයෙන් ගී දෙකක් තුනක් ගැයීම ඔහුගේ සිරිතෙකි. බුදු දහමට ද හේ හැබෑ ඇල්මක් දක්වයි. එහෙත් අනෙක් කිසි දු ආගමක් මඩිනා ආරේ තැනැත්තෙක් ද නො වේ.

ඔහු ගේ බස සුමට යැ; ලිහිල් යැ. අදහස් ගැඹුරු යැ; අලුත් යැ. එ හෙයින් ඔහු ගේ පතපොත නිසා අද මුළු මහත් ලොව මැ සියත් සිතීමට, නිදහස් වැ කල්පනා කිරිමට පුරුදු වී සිටිත්. මොහු ගේ ලියැවිලි ලොවේ මහජන මතය හැඩගස්වාලීමෙහි ලා දැක්වූ බලය සුළුපටු නොවන බව ඔහු ගේ දේසපාලන අදහස්වලට විරුදු මත දරන්-නෝ ද පිළිගනිත්. ඔහු සිය දුවට සිරගෙයි සිටැ ලියූ ලිපි පෙළ මැ අද ඉංගිරිසි ලිවිසැරිය සරසන මහරු ගත් රුවනෙකි.

සයිමන් කමිසුමට එරෙහි වැ නැඟී සිටි නේරුතුමා පොලිසි සෙබළුන් ගෙන් හොඳට මැ කස පහර ලැබී යැ. 1928.12.3 වැනි ද ඒ සිදු වීම සඳහමින් ලිපියක් ලියූ බාපු – ගාන්දි – ඔහු ගේ දිරිමත් නිසසල බව පසසමින් ලියූ ලිපියෙන් අනාගතයේ දී බාරකය ඔහු ගෙන් ඔප් නැංවෙන බවට ඉඟි කොටැ ඇති. නේරු නො එක් දෙනා ගෙන් ලද නො එක් ලිපිවලින් මගේ සිත් ඇදගත් මහඟු ලිපියෙක් වෙයි. එය එවූණේ මුළු ලොව උවහස් රෙසෙන් පිනැවූ, ජෝජ් බරනාඩු සෝ කිවියා විසිනි. 1948 සැප්තැම්-බර මසැ 18 වැනි දිනැ නේරු වෙතැ එවුණු ඒ ලිපියේ මේ අදහස ද ඇති. "මා වරක් බොම්බායේත්, ලංකාවේත් සතිය බැගින් නැවැතී සිටියා. දඹදිව ගැනැ මා මොනොවට දන්නේ ඒ එමණ යි. හෙළ දිවැ කවුරුනුත් නොවෙනස් මුල් රුවක් දක්වනුයෙන් හෙළදිව, මිනිස් වගේ නොටිල්ල යැ යි මට හැඟිණි."

දඹදිවැ ලස්ස ගණන් දුප්පත් පොදු ජන පෙළින් පහළ නො වී, නුගත් පුහු ඇඳිහිලි ඇති දනන් කෙරෙන් දුරින් මැ දුරු වී, උසස් මැ බමුණු පෙළෙකැ උපත ලබා ඉහළ ඉගෙනිමක් ලද මොහු අද දඹදිවැ මුළු මහත් ජන රැස ගේ එ තරම් සිත් ගත් නයු වා වූ අයුරු අපේ රටේ ජන නායකයන් හට පමණක් නො වැ පොදු ජනයා හට ද හොඳ පාඩමක් උගන්නයි. උසස් අදහස් ඇති, පහත් පැතුම් නැති අය මැ නායක කම් ලැබීමට සුදුස්සෝ වෙත්.

1952 නොවැම්බර මසැ 18 වැනි ද, දඹ දිව පාරලිමේන්තුව අමතා මොහු කී බස් අද අපේ රැටියන් මැනැවින් මතක තබා – ගත යුත්තෙකි. **"එක්කෝ අපි අප විසින් මැ නිපැදවෙන අහරින් ජීවත් වෙමු. නැත් නම් එ සේ අහර සපයාගැනීම සඳහා දරන වෙහෙසින් මැ මියෙමු."**

දූහුන පබඳ

I

කළ ගුණ

කාලිංග විජයවර්ධන

බල්ලා නාඳුනන අයට ගොරවනවා; සමහර විට ඒ අය හපාකනවා. ඒ වුණාට හඳුනන අය දුක්කා ම ඌ වලිගේ වනනවා; හිලෑ බවක් දක්වනවා. ගුණ සැලැකීම තිරිසන් සතුන් අතරේ පවා ඇති ගතියෙකි.

මේ ගුණයෙන් මිනිසා හැම තිරිසනාට ම වඩා එක්කෝ ඉහළ යි; නැත්නම් පහළ යි. ඒ පහළ අයට නරක මිනිසුන් ය කියා කියනවා; ඉහළ අයට හොඳ මිනිසුන් ය කියා කියනවා.

නරක ළමයි නරක මිනිස්සු වෙති. හොඳ ළමයි හොඳ මිනිස්සු වෙති. ළමයින් ගේ මේ හොඳ නරක මැනගත හැක්කේ කුඩා කල ඔවුන් කළ ගුණ සලකන හැටි-යෙනුයි.

දෙ-මව්පියන් පමණ දරුවන් හට හිතවත්තු නවත් නෑ. මේ බව දන්නා හොඳ දරුවන් ඒ දෙ-මව්පියන් හට ගුණ දක්වනවා. ලොකු වුණාට පසුත් ඒ වාගේ ම යි.

මවුපියන් ළඟට ළමයිනට වැඩ සිදු කරන අය තමා ගුරුවරු. එ බඳු ගුරුවරුන් අතරේ නම් ළමයින් ඉහළ යවන අය මිසක් පළි ගන්නා අදහසින් වත් ඔවුන් පහළ හෙළන ජාතියේ අය නැතැයි සිතමි. ඉන්නවා නම් එය ගුණ නොදන්නා නරක මිනිසුන් ගුරු-වරුන් වීමේ වරද මිසක් ගුරුවරුන් ගේ වරද නො වේ. කෙසේ වුණත් පොදුවේ සලකන විට මවුපියන් ළඟට ළමයින් කළ ගුණ දක්විය යුත්තේ ගුරුවරුන් හට යි. ළමයින් ගෙන් ගරු බුහුමන්, සැලැකිලි පුද පඬුරු ලබන ඒ හොඳ ගුරුවරුන් ද කළ ගුණයට පෙරළා කළ ගුණ දක්වීම ද නො වැළැක්විය හැකි හොඳ මිනිස් ගති-යෙකි.

ගුරුවරුන් ගෙන් ඉහළ ම ගුරුවරයා නම් තිලෝගුරු තුමා යි. එ තුමා තමාට බුදු වීමට හෙවණ දුන් හිත් පිත් නැති බෝ ගහටත් සතියක් ගුණ දක්වූ බව කියති. එ සේ නම් අපි අපට හැම ද උදව් කරන ගුරු දෙ-ගුරුන් හට කො තෙක් කළ ගුණ දක්විය යුතු වෙමු ද?

II

බකමූණා ගේ කතන්දරය

තු. ම. විජේසූරිය

'බකමූණෝ!'

'හූම්! හූම්!'

'ඇයි, බකමූණෝ, ඔක්කෝට ම හූම් කියන්නේ ?'

'ඒක මහ දිග කතාවෙකි, බබෝ.'

'ඒ කතාව අපටත් දැනගන්නට කියන්න බකමූණෝ'

'මාත් ඉස්සර ඔබ වාගේ ළමයකු ව උන්නා. ඒ කාලෙත් මගේ සිරිත ඔක්කෝට ම හූම් තමයි. මට පුළුවන් වැඩේටත් හූම්! බැරි වැඩේටත් හූම්! දන්නා දේටත් හූම්! නොදන්නා දේටත් හූම්! මගේ මේ ගතිය නිසා මා හරියට බැණුම් අහනවා, සමහර විට බැට පවා කනවා. ඒත් ඒ හැම දේ ම මා පිළිගත්තේත් හූම් කියා යි.

පස්සේ, ලොකු වුණාට පස්සේ මා ගියා රස්සාවල් හොයන්න. කෙනකු මගෙන් ඇහුවා ඔබට මේ රස්සාව පුළුවන් ද? ඒකටත් හූම්! තව කෙනකු ඇහුවා ඔබට මේ රස්සාව පුළුවන් ද? ඒකටත් හූම්! හැබැයි මට ඒ එක රස්සාවක් වත් බැහැ. පස්සේ ඒ ගිය හැම තැනෙකින් මා එළවා-දැමුණා, ඒත් ඒ හැම එකක් ම මා පිළි-ගත්තේ හූම් කියා යි,

අන්තිමට මා පුරුදු වුණා හොර කමට. දවල් තිස්සේ ම මගේ සිරිත නිදාගැනීම යි. රෑට පිබිදී හොර කමේ යනවා.'

'තාමත් ඒ සිරිතට නේද බකමූණෝ දවල් නිදා සිට රෑට ඇවිදින්නේ?'

'හූම්!' දවසක් හොර කමේ ගොස් ගුටි කා මළා, ඒ පාර බකමූණා වුණා. ඉතින් පරණ පුරුද්දට දැනුත් මා හූම් කියනවා.''

III

ගොඳුරේ ගොඳුර

මිලින්ද හෙට්ටිආරච්චි

යහල්දුව! ඒ තමා අපේ වත්තේ නම. ඇත්තට ම ඒ කදිම ලස්සන බිම් පෙදෙ-සෙකි.

එ ද සවස මා වත්තේ ඇවිදිමින් උන්නා. එ සේ ඇවිදින මගේ ඇස පුදුම දෙයක් දක්කා, පයත් ඒ අනුව නැවැතුණා.

එක කුරුමිණියකු ගොම ගුළියක් පෙරළා-ගෙන කන්ද ඉහළට යනවා. ඌ හරි අමාරුවෙනුයි ඒ ගමන යන්නේ. එ විට ම එහි ආවා උදව්කරුවකු. ඒත් කුරුමිණියෙක්. දැන් දෙන්නා ම එකතු වී අර ගොම ගුළිය ඉහළට ඉහළට පෙරළාගෙන ගියා.

කන්ද මුදුනේ එක තැනෙක දී ඇවිළුණා දෙන්නා අතරේ රංඩුව. එකකු ඒ අතටත් අනෙකා මේ අතටත් ගොම ගුළිය පෙරළන්නට යැමෙනි රංඩුව ඇවිළුණේ.

මා බලා උන්නා; ටිකක් වේලා බලා උන්නා. දෙන්නා ම ඇරියේ නෑ. පස්සේ ගොම ගුළිය අත හැර උන් උන් පොර කෑවා.

එ විට ම කොයින් ආවා ද මා දන්නේ නෑ. එහි ආවා තලගොයි නාම්බකු. එක කටට කුරුමිණියන් දෙන්නා ම පටස් ගා හැපුවා. හපන විට ම කොයින් ආවා ද මා දන්නේ නෑ. කබර ගොයකුත් දිවගෙන ආවා. තලගොයා ගේ ඔළුව ම ඇල්លුවා.

ඊ ළඟට පොරය ඇති වුණේ කබර ගොයාත් තල ගොයාත් අතරේ යි. කබරාත් ඇරියේ ම නෑ. තල ගොයා ඔළුවෙන් ගෙන දෙ පැත්ත ගහන්න වුණා, තල ගොයාත් දැහැලුවා. ඒත් දැහැලිලි ටික ටික නවත්වා ඒ මහ බිංගේ ඇතුළට නේන ගමන ගියා.

මා ගියා ගෙදර.

IV

අත් දැකීමෙන් ලද පාඩම

රොහාන් ද මැල්

මම – හා! අර පහන් දැල්ලේ ලස්සන! කදිම පාට! යන්න ඕනෑ ළඟට ම එය බලන්න.

පහන් දැල්ල – ලස්සන හැම දේ ම මිහිරි නැහැ!

මම – මොන බොරු ද? මල් ලස්සන යි; මිහිරි යි. ගෙඩි ජාති ලස්සන යි; මිහිරියි.

ප: දැ: – එහෙත් කපුරු මල ලස්සන යි; සැර යි. වැටකෙයියා ගෙඩිය ලස්සන යි; වස යි.

මම – ඔබත් සැර ද? වස ද?

ප: දූ: – ඒ කියන්නට බැහැ. මගෙන් වැඩ ගන්නා හැටියට යි මා සැර වන්නේ, මා වස වන්නේ.

මම – එහෙනම් මා ඔබෙන් වැඩ ගන්නවා. එන්න මාත් එක්ක සෙල්ලමට.

ප: දූ: – ගින්දර සමඟ සෙල්ලම් කරන්න එපා ය කියා කියමනක් තියෙනවා. ඔබ එය අසා නැද්ද?

මම – අසා තිබුණත් මා එය පිළිගන්නේ නෑ. ඔබ හරි ලස්සන යි. ඔබත් එක්ක සෙල්ලමට මට ආසයි.

ප: දූ: – මා හා සෙල්ලමට හුළඟ ඉන්නවා, මට ඇසුරට තෙල්, දර, පරඬල ආදිය තියෙනවා.

මම – අනේ, අනේ, මා ඔබට දර පරඬලා තරම් වත් වටින්නේ නෑ! ඉන්න මා ඔබ අල්ලා මිරිකා දඹුවම් දෙනවා. ඌයි! ඌයි!

ප: දූ: – ඔව්, ඔව්, අත් දැකීමෙන් ඒ ලබාගත් පාඩම අගෙයි!

V

නිල මැස්සා මී මැස්සාට නුවණ දීම

උපාලි මොරවක

අනේ, අනේ, මේ මී මැස්සනට හැදී ඇති පිස්සුවෙක මහත! කුමට ද මල් සොයා යන්නේ මල සොයා යනවා මිසක්?

උදේට පිපෙන මල් හවසට පර වෙනවා, එ විට එහි අගයෙක් නෑ. එහෙත් මල නම් පර වුණු තරමට යි – පරණ වුණු තරමට යි හොඳ. බැරි ද මුන් හට ඒ වායින් රොන් ගන්නට?

මොවුන් මල් පැණි එකතු කරනවා. එයත් හරි ම මෝඩ වැඩෙක් තමා. ඉන් වැඩ ගන්නෝ නම් මිනිස්සු ය. අන්න ඒකට අපි! අප මිනිසුන් ගෙන් වැඩ ගන්නවා. අපට මල සපයාදෙන්නෝ මිනිස්සු යි.

නිදහසේ අගයක් මේ මී මැස්සනට වැටැහෙන්නේ නෑ. ඒක යි කොයි වේලා-වේත් කුඩු වී එක පොදියට ඉන්නේ. අප නම් තනි තනි ව නිදැල්ලේ හැසිරෙනවා. කො තරම් වාසනාවෙක් ද ඒ?

ගෙවල් හැදිල්ලත්, දරුවන් හැදිල්ලත්, රැකබලාගැනිල්ලත් හරි ම හරි කරදර වැඩ තමා මී මැස්සනට. එහිත් කිසි කරදරයෙක් අපට නෑ.

ඇයි මී මැස්සෙනි, ඉතින් අපෙන් ගුරු කම් නොගන්නේ? උගනිවු අප ගෙන් පාඩම දැන් වත්.

VI

නැගෙනහිරේ දූක

ගැමුණු තිලක් ප්‍රනාන්දු

හැම ද මත් නැගෙනහිරින්
පැයීම යි මගේ සිරිත
එහෙත් හෙළේ නැගෙනහිරින්
නැඟ එන විට රිදෙයි ම-සිත

සක්වළ මහ හෙළිය මම යි
මගේ නමින් ලොවේ ම ඇති
එක රට මේ හෙළය තමයි
එක දූය මේ හෙළයා ම යි

එහෙවූ හෙළේ හෙළයන් ගේ
හිසට උඩින් නැගෙනහිරින්
ආ මා අද නැහැ එන්නේ
පරයන් ගේ හිසට උඩින්.

එළාර හටනට බත් දුන්
දිගාමඬුලු කුඹුරු යාය
අද ඒ පරයන් අතෙහි ය.
නැගෙනහිරේ තතු මෙ වැනි ය.

හෙළයෙනි තොප ගේ රුහුණේ
පෙර දිග පරයනට ගියොත්
මට පායන්නට වෙන්නේ
බස්නාහිර දෙසින් තමයි.

සිව් - හෙළය

වෙල්ලාල ජයමහ

සිවු - හෙළය! මේ අමුතු හෙළයෙකැ යි පුදුම නොවන්නැ. උඩ බිම නො-බලන්නැ. මෙහි මුලැ දී වූත්, මතු වියැ යුතු නම් එසේ වියැ යුතු වූත් එක මැ හෙළය මෙ පමණක් බව සලකන්නැ. අපේ රට පිළිබඳ වූත් හවුරුදු දෙ දහසකටත් වැඩි කලක් යට පත් වැ පැවැති පරම හැබෑව එළි කරනුයේ ද මේ සිවු-හෙළය බව අදහන්නැ.

දූන් ඉන්දියානුවන් ගේ සැඳ පතන දැ මරුවන් උනට පුර වැසි හිමි කම දී, 'අපි ජාත්‍යන්තර වමු,' යි කියන්නා සේ, බුදුන් දඹදිවැ උපන් නිසාත් බුදු සමය දඹදිවින් මොබ පත් නිසාත් ලක් මව ගේ ගෙල කඳින් කැඩී - යන තරම් මහ බරට එ ද නිවන් පතන දැ මරුවෝ දඹදිව ඇගේ හිස මත ගත්වා, 'අපි දඹදිවින් මෙහි පැමිණියෙමු' යි කියන්නට වූ හ. අහෝ එයින් මෙයින් අපට වන, වූ මහ විපත්! එයින් අපේ රට වැටිණි; දූය දැවිණි. තව තව ද රට වැටෙන බවට දූය දැවෙන බවට ලකුණු ද සිවූ අතින් පෙනේ.

දූන් බසිමු 'සිවු-හෙළය නම් කිමෙක් ද?' යන සෙවිල්ලට. මේ කටයුත්තට බසින්නා පළමුවෙන් මැ කට යුත්තේ අපේ යටගියාවේ සියලු සැබෑ තතු වසා-ගෙනැ ඉන්නා විදැවා (විජයයා) සහ සොර මුළ මහවසින් (මහාවංශයෙන්) බලයෙන් ගෙනැ පසකට ඇදූ-දැමීම යි. ඇදූ-දමා එ තැනින් පැදෙන එළියෙන් යටගියාව දෙස බලමූ. අහෝ විදැවා සහ සොර මුළට කැතේ පිළිකුලේ සැහැවී සිටැ මතු වන අපේ දූය පිළිබඳ සැබෑ තතු! ඒ බලා ඇති වන සතුට! තමන් ලියූ දැ තමන් මැ නො දූනැ එ ලියූවන් කෙරෙහි පහළ වන සිනාව! උනට ක්‍රන්නට සිතෙන සරදම්!

බැලුව මැනැවි, සත් සියයෙකැ පිරිසක් සමහ පැමිණි විදැවා තම්මැන්නාවට ගොඩ බැසැ වෙහෙස නිවා-ගන්නට උනුත් සමහ මැ 'දෙයියනේ' කියා දෝ වෙරළේ වැතිරැ-උන්නා ලූ. බලවත් පවසක් නිවා ගන්නට දිය සොයා එක-එකා යැව්වා ලූ. ගිය එකකු පමා වනු බලා නොවැ තව එකකු ගියේ? පමාවටත් ගමනටත් එකකුට අඩු ගණනේ මිනිත්තු පහක් දුන ද සත් සියයක් දෙනාට මිනිත්තු තුන් දහස් පන් සියයක් (3500) – දින දෙක (2) යි හෝරා දහය (10) යි මිනිත්තු විස්සක් දියැ යුතු යැ. කුස ගින්න ඉවැසුව ද දිය පවසත් මෙ සේ ඉවැසියැ හැක්කෙක් ද? මින් පෙනෙනුයේ මේ පැමිණියවුන් මිනිසුන් නොවන බව යි. මොහු නම් පන ඔබුවෝ යැ! පුදුමෙකි! නුපුරුදු රටෙකැ දිය සොයා ගියේත් එක-එකා තනි තනි වැ මැ යැ. මහ ඒකා ගියේත් එ සේ මැ යැ. මෙ ද මිනිස් ගතියෙක් නො වේ. මෙහි සිටියෝ කවර යක්කු ද? මෙන්න මූ තමා හරි මැ යක්කු!

කදිම කුමරෙකි, රජෙකි, මේ විදැවා! විපතක් පැමිණය හ යි සිත-සිතා මැ පිරිස යැවූයේ – ඉවර වන තුරුත් යැවූයේ එක-එකා මැ යැ. රටක් වවන්නට දූයක් වවන්නට කියා-පූ මිනිසා! අහෝ මහනමුනි! මිත්ත-ණියන් සිංහයකු පස්සේ යැවූවෝත්, පියාණන් ලවා තිරිසන් කමත් කැරැවූවෝත්, ඒ මෙ මුනුපුරා-පුතා-විදැවා, සිංහල බැල්ලක පස්සේ යැවූවෝත් ඔබ මැ යැ. මහනමුනි, ඔබ ගේ මුතුන් මිත්තෝ ද මේ? ඔබට පින්!

හැරෙමු මාර ගහ වත්තේ (ශිරිෂ වාස්තු පුරයේ) මහල් ගෙදර දෙසට. හෙළ දිවැ නන් අතින් පැමිණි බොහෝ රජවරු වූහු ල, එ ද එහි. ඔහු එක් වැ මහල්

කැහු ල, ගැයූහු ල, වැයූහු ල, නැටූහු ල, හා! හා! දනුදු යක්කු වෙති ල. ඔහුත් මෙ සේ මඟුල් කති ද? ගයති ද? වයති ද? නටති ද? එ සේ ඔවුන් කරනවා දුටු කෙනෙක් වත්, ඇසූ කෙනෙක් වත් වෙති ද?

කෙළි දෙළෙන් මත් වැ උන්, එ රජ ගෙදරැ පිරිස් කරා පැනැ පිරිස ඇතුළු විදැවා උන් කැපි ල, මැරී ල. දූන් මිනිසුනටත් පුළුවන් ද, යකුන් කපන්නට-මරන්නට? හා! හරි! උනට නැ නොවැ කුවෙණිය දුන් මතුර-රැට සැහැවුම් ගන්නා මතුර-ඉර බට කලැ කා හටත් ලැබෙන මතුර-අඳුර!.

පරණ නොහොබනා කම් මතු කොටැ-ගෙනැ අහඹුයේ පැනැ මඟුල් ගෙදරැ පහන් ගිනි නිවා, එ ඇත්තන් මරා-ලූ පමණින් ගැහැනියක ගේ - කුවෙණිය ගේ - බිං ගෙයි හත් සියයක් පිරිසත් සමඟ අසරණ බවට යන දුඹුලෙක් - නිවටයෙක් - මුළු රටේ රජෙක් වෙයි ද?

ඇදෙමු බුදුන් මෙහි වැඩි තුන් ගමන දෙසට. ගනුමු පළමු වැනි ගමන. මහවිලි ගං තෙරැ සටනට රැස් වූ යකුන් කරා බුදුන් වැඩියෝ ල. ගිරි දිවයින ගෙන්වා උන් එහි නංවා පා කැරැ හැරියෝ ල. හැයි ද මෙ බඳු දෑ ඇඳ-බා බුදුන් ගේ සිරි නම කිළිටි කරන්නේ? එ ද බුදුන් මෙහි වැඩියා නම් වඩින්නට ඇත්තේ, යකුනට විපත් පමුණුවන්නට නො වැ සැපත් පමුණුවන්නට මැ යි. ගිරි දිවයිනට යැවූ හ යි කියන්නේ ඔය වියරුවට නො වියැ යුතු යැ. කැලැණි-තිස් සමයෙහි දී වෙති යි පෙනුණු මහ බිම සැලුමෙන් වන මහ විපත, දූන් පවත්නා මේ බිම් කඩ මෙන් එකොළොස් ගුණයක් පමණ වූ ඉමහ බිම් කඩක් එහි වූ සියල්ලත් සියල්ලවුනුත් සමඟ මුහුදු බත් වනු දූකැ පරෙස්සම් . වනු සඳහා රට මැදූ වූ ගිරි මුදුන්හි වසන්නට උනට මුනට කහටත් ඔවා දෙනු පිණිසැ වියැ යුතු යැ.

දෙ වැනි ගමනේ බුදුහු නයින් ගේ මැණික් පුටු හබයක් විසඳන්නට වැඩියෝ ල. නයිනට නම් කවර පුටු හබයෙක් ද? හුඹස් හබයක් මැ විනා ද. සැබැව නම් එ ද නා හෙළයන් මැණික් පුටු ඇති වැ වෙසෙන තරමට, එ පුටු බුදුන් ලවා පිරිබොවා, නිදන් කොටැ මහ සෑ බඳවන තරමට පින් මහිමයෙන්, ගුණ මහිමයෙන් දියුණු වී උන් බව යි.

ගනුමු බුදුන් ගේ තුන් වැනි ගමන. කොටින් කියමු. මිණි ඇසි නා රජුන් ගේ ඇරියුමෙන් පැමිණි මේ ගමනේ දී කැලණි ගඟෙහන් නා, එහි සිරි පතුල් පිහිටුවා, කැලණි මහ වෙහෙර බැඳෙන්නට සලස්වා, සමන් දෙවියන් ගේ ඇයැදුමෙන් අතර මඟැ කිප පලෙකැ නැවැති සමනොළ වැඩැ, එහි සිරි පතුල් පිහිටුවා, තව තව ද වැඩ සඳහා හෙළදිව පුරා ඇවිදි බවක් කියති. එ ද හෙළදිව මිනිසුන් ගෙන් හිස් නම් යකුන් ගේ නයින් ගේ හොල්මන් පමණක් මෙහි තිබුණා නම් බුදුහු කුමට මෙ සේ රට පුරා සරති ද? තව ද කියැ යුත්තෙකි. අප ගේ බුදුන් සේ මැ මේ මහ බදුරු කපේ පෙරැ බුදු වූ කකුසඳ, කෝනාගම, කසුප් යන තුන් බුදුන් ද මෙසේ මැ මෙහි වැඩි බවත් එ තුමන් ගේ සසුන් ද මෙහි පිහිටි බවත් දූන් පවත්නා අට මහ තැන්, සොළොස් මහ තැන් සියල්ල පෙරැ වූ ඒ ඒ බුදුන් ගේ සෙමෙහි ද වූ බවත් කියති. එහෙත් විදැවාට පෙරැ මෙහි මිනිසුන් නො වැ යකුන් විසූ බවක් කියති. පෙරැ වූ අපේ මහ ඇදුරු, දැ මරු සාමි දරුවන් රට උගළන්නට අටවන බොරුවෙකැ මහ උජාරුව බැලුව මැනැවි. "මේ ශ්‍රී ලංකාද්වීපය නම් අබුද්ධොත්පාද කාලයෙහි යක්ෂයනට මැ වාස වෙයි." හෙළදිවට මැ වෙසෙසි වූ දහමෙකි මේ. ලබා ඇති මේ බුද්ධොත්පාද කාලය ගෙවෙන්නට තව ඇත්තේ අවුරුදු දෙ දහස් පන්සියයකට බිඳක් වැඩි කලෙකි. දූයක්

විසින් ගත් කලැ, මෙ එ තරම් කලෙක් නො වේ. සියල්ලට ඇත්තේ මේ සුළු කල යැ. අහෝ! අනෙක් දෙ දහස් පන්සියය ඉවර වත් මැ අප හැම නිවන් දකිනවා ද? නැත, අප ගේ හුස්ම ටික හෙළ හුළඟට එක් වෙනවා ද?

සත් සියයක් පිරිස හා පත් විදැවා මැ යැ, එක මැ සීහළයාත් සිංහලයාත්, ''සීහං ලූනාතී'ති'' ඈ ගැළැපෙනුයේ ඔහුට පමණෙකි. ඔහු ගේ පිරිසෙහි වූවෝ බැහැරියෝ යැ. ඔහුට-ඒ විදැවාට, ලැබුණේ පුතකු හා දුවක හා පමණෙකි. එ දෙ දෙනා එ සේ මෙ සේ වූවෝ නො වෙති. සිය පියා ගේ දෙ මා පියන් සේ මැ සම වූ ගුණ දහම් ගති පැවැතුම් ඇත්තෝ වූ හ. එ මහ පින් මහිමයෙන් වැදි පරපුර බෝ වියැ! විදැවාට වෙන· දරුවකු නැති හෙයිනුත්, උන් ගෙන් බෝ වුණු එක මැ පරපුර වැදි පරපුර හෙයිනුත් වැදි පරපුරේ මුල් පියා නම් විදැවා යැ! විදැවා ගේ දරු පරපුර වැදි පරපුර යැ; අපි නො වමු.

සිවු හෙළයෝ නම් මෙහි මුලැ සිටැ විසූ අසුර රකුස් යක් නා යන සිවු කුලෙහි හෙළයෝ යැ. පඬු අබාවෝ දඹදිවින් නිබඳ ඇදෙන උවදුරු දැකැ, තව තව මෙ සේ බිඳී ගිය හොත් රට දැ වැටී නැසී-යති යි බිය පත් වැ මේ පැරැණි සිවු–හෙළ කුල එක් කොටැ, සිවු-හෙළ නමින් හඳුන්–වන්නට අණ කළ හ. මෙ සේ සිවු හෙළ යන්න කලක් වැහැරැවීමෙන් නිපන් සී-හෙළ යන්න බලා, සියලු කල්හි රටත් දූයත් දඹදිවට පාවා–දෙන්නට යැතූ පාලි ඇදුරෝ 'සීහළ' යන්නක් ද, සකු ඇදුරෝ 'සිංහල' යන්නක් ද මවා - ගත් හ. එහෙත් හෙළ රටට, හෙළ බසට හෙළ කටට එක'තින් මැ හුරු යැ සීහෙළ යන්න. බැලුව මැනැවි නිපැදියාව.

සිවු + හෙළ – සීහෙළ
සිවු + පද – සීපද
සිවු + රැස්ස – සීරැස්ස (හීරැස්ස)

තව ද,–

මුල් + ගිරි ගල – මූගිරි ගල
නුග + පේ – නූපේ
දෙව් + දූනු – දේ දූනු
ඔව් + මියා – ඕමියා

යනුදු සලකන්නැ.

දූන් ඉතින් ''සීහං ලූනාතී'ති සීහලො'' යනුත් ''සිංහං ලූනොතී'ති සිංහලඃ'' යනුත් 'පරිං •පුප්පතී'ති පරිප්පු' යනුත් 'ගත-ගතස්ථානෙ කොව කොචඃ කරොතී'ති කෝච්චි'' යනුත් පරලෝ වඩී වා! නැවැතැත් කියමි. අපේ මුල සීහළ හෝ සිංහල හෝ නො වැ සිවු-හෙළ බව මැ සලකත් වා! මේ හැමට මුල – සැබෑ මුල හෙළ යනු මැ හෙයින් අපේ රටත්, දූයත්, බසත් වෙසෙසියැ යුත්තේ හෙළ රට, හෙළ දූය, හෙළ බස කියා බව මැ තරයේ සිතට ගනිත් වා!

(එළිය 1949)

ලබන එළිය

විදුලකර සරසවියේ යටගියාව පිළිබඳ වදරු
සිරිමල් රණවැල්ල සූරීන් ගෙන් පැරැණි යටගියාව පිළිබඳ ලිපි පෙළෙක් ද

පළපුරුදු ඇදුරු කෙනකු ගෙන්
පොදු සහතික පත් (G. C. E.) සෝදිසියට සැරැසෙන්නවුනට

'ලංකා ඉතිහාසය' පිළිබඳ රුකුලෙක් ද
එන එළියේ සිටැ පළ වේ.

අසරණ හදවත

විනී විතාරණ

මගේ හදවත කකිය – කකියා
    වෙව්ලමින් ගැලැවී ළයින්
මෙ කුළු පොළොවේ වැටී ඉල්පී
    විහිදුණා රුදු දුක් මෙයින්

තියුණු ගල් තුඩු මතැ වැදී එය
    පැන්නී – පැන්නී කැරැකුණා
ඈතැ ගැඹරේ ගලා – ගිය සැඩ
    කුරිරු ගඟ වෙතැ පෙරළුණා

රකුස් දත් පෙළ සෙයින් නියැවුණු
    එ ගන පෙණ තුළැ කිමිදිලා
සරොස් දිය කඳ මරු සළා දුන්
    පරොස් පහරේ තෙරැපිලා

අහෝ මා ගේ එක මැ හදවත
    බැමැවී – බැමැවී ඇදී – ඇදී
පහර නෙක වන් පන්දුවක් සේ
    පැන්නුණා එහි මෙහි වැදී

ඉරි තැළී සිරි සලා ලේ
    වියරුවෙන් දුක් නො නැවැතී
වලග ලොප් වුණු මසකු විලසින්
    අසරණ වැ ගැහෙමින් නිති

දරුණු කොලහල වලප් නංවා
    පැසී – පැසී පිපිරී රොසින්
කඩා ඇදූ – හුණු එ දිය ඇල්ලෙන්
    පහත වැටුණා මහ උසින්

නොදත් ගැඹරැ'ති නොදත් නපුරින්
    ගහන ඒ සැඩ සුළි දියේ
මගේ සියුමැලි හද වසාගති
    තවත් මතු වනු නෑ දියේ

අනේ අසරණ මගේ හදවත
    කවර අරමුණු සොයා දෝ?
රුදුරු උවදුරු අඳුරෙ තනි වී
    කවර පිහිටක් පතා දෝ?

– එඩිය (1959)

මල් ගොමුව

චන්ද්‍රා ආශුබෝධ

I

අහිංසක
සමන් මල
හැංගුණා
ගොමුව තුළැ.

නෙදූ'ති සැර
කපුරු මල
පෙරට වීත්
පෑ යැ මට.

එහෙත් මා
දකින්නේ
සමන් මල
සමන් මල.

II

නැහෙන මල් කැකුළෙකි.
ඇය රැකුමැ ගස වෙහෙසෙයි.
මල පිබිදිණි; බිඟු රැවින්
දූන් ඉස්පාසුවෙක් නැති.
මල මැලැවී-ගියේ.
දූන් ඕ ගසටත් බරෙකි.

III

බමරා ආයේ යැ.
පෙම් වදන් බැණැ මල සිඹැ
රොන් ගෙනැ සනසා ගියේ
ආයෙත් එම් යි කියමින්.

කුරුම්ණියා ආ යැ.
රළු බස් බැණැ මල තළා
රොන් තුබූ තැනත් ගෙනැ
වනසා යන්නට ගියේ.

'පාරිභාෂික' පටලැවිල්ල

රජයේ බස සිංහලය වූ ද සිටැ සිංහල සිප් වදන් වෙනුවට කිසි බසකට නැති 'පාරිභාෂික ශබ්ද' යන්නෙක් සිංහලයා පිටැ පැටැවෙන්නේ යි.

පාරිභාෂායෙන් වැඩ ගන්නට තැතැනුවෝ අවුලෙන් අවුලට මැ වැටුණෝ යි. එහෙත් **පාරිභාෂාව** රකින්නට සම්හරු නැත් දූරු හ. උනට නිසි පිළිතුරු සපයන්නට දෝ **රජයේ විදිලි අදිකාරියත් ලංකා මිහි තෙල් මඩුල්ලත් සුදුසු හෙළ සිප් වදන්** තනා වැඩට ගත් හ.

ඒ හෙළ සිප් වදන් හැකි තරමින් රටට දෙන්නට ගත් තැනෙකි මෙ.

(ශිය කලඹ හා බැදෙයි)

Needle valve උලටි වැළිවෙය
Negative රිණ
Negative feedback රිණ පසුපෙවුම
Neon Sign නියොන් සන
Network දූලවිය
Neutral නැලිය (නො + ඇලි)
Neutral conductor නැලි පිරියවනය
Neutral connection නැලි ඇවිණිය
Neutral earthing resistor නැලි මිහියැවුම් රොදුව
Neutral floating නිදූලි නැලිය
Neutral line නැලි රැහැන
Neutral point නැලි තිත
Niche කැවිගබ
Noise අවසද
Noise limiter අවසද ඉම්කුරුව
Non-conductor නොපිරියවනය
Non-essential load නො - ඇවැසි බැරය
Non-tinear impedance නො-ඉදිහුරු ගැහැවිය
Non reactive නොපිළිකුරු
Non reactvie Load නොපිළිකුරු බැරය
Nuclear නැබියුරු
Nuclear energy නැබියුරු ඔද
Nuclear fission නැබියුරු විපැලුම
Nuclear power නැබියුරු බලය
Nucleus නැබියුරුව
Neutron නැලිරොන (නි + ඇලි + රොන)
Nill point නැති තිත
Obsolete යල් පිනූ
Obsolete number යල් පිනූ නම්වරය
Observe නිරික්සයි
Observation නිරික්සුම
Observatory නිරික්සුම්හල
Observer නිරික්සු
Off peak period නොකුළු සමය
Ohmmeter ඕම්මනුරුව
Oil filter තෙල් පෙරනය
Oil pump තෙල් පිරියත
Oil filled තෙල් පිරැවි
Oil ring තෙල් මුද්ද
Oil seal තෙල් සවැරිය (ස + වර)
Operation මෙහෙයුම
Order (V) අණවයි
Order (N) ඇණැවුම
Order card ඇණැවුම් පත
Order, foriegn විදෙසි ඇණැවුම
Order, local මෙදෙසි ඇණැවුම
Ore ලොපස්
Ore, iron යපස්
Oscillate ඔසැලේ (ඔ + සැලේ)
Oscillate, to ඔසලවයි
Oscillation ඔසැලුම
Oscillating fan ඔසැලෙන පංකාව
Oscillator ඔසැලෙනය
Oscillatory ඔසැලි
Oscilloscope ඔසැලික්සුව (ඔ + සල + ඉක්සුව)
Oscilloscope, cathode ray [C. R. O.] රිණ විදුදෙරු රැස් ඔසැලික්සුව [රි. වි. රැ. ඔ.]
Outdoor එළිමහන
Outdoor substation එළිමහන් උපපොළ
Outdoor switchgear එළිමහන් වහරුවාරණ
Outdoor terminal box එළිමහන් නිමා කැටය
Outline වැටිසන
Outline, rough දළ වැටිසන
Oven පෝරනය
Ovenproof (V) පැලැහිවරුවයි
Ovenproof පැලැහිවැරැවි
Over bias (V) ඉකුම් පසදී
Over biased ඉකුම් පසැදූ

කුමාරතුංගයන් ගේ ධී ශක්තිය

දෙවිනුවර
කා. රූපසිංහ

1963. 11. 9 දිනමිණෙහි 'සාහිත කෙතේ වල් පැළැටි 'මැයෙන් ලිපියක් පළ කළ හ, ගුණදස අමරසේකරයෝ.

ඔවුන් ගේ ලිපියෙහි එන මේ අදහස් ගැනැ අප ගේ සැලැකිල්ල යොමමු.

(1) ......කුමාරතුංග ආදීන්ගේ කවි, රස දනවනසුලු රචනාවන් වූයේ සම්ප්‍රදය අනුගමනය කළ නිසයි.

(2) 'අළගියවන්න සතු ධී ශක්තිය වත් කුමාරතුංගට නො තිබුණි'

(3) 'ධී ශක්තිය ඇති කවියාට කාව්‍ය සම්ප්‍රදය මත දෙ පා රඳවා නැඟී සිට එය උඩුකුරු යටිකුරු කර බලා සිඳ බිඳ යළි එය සැකසිය හැක'

මේ අදහස් එකක් අනෙක හා ගැළැපෙන අපූරුව බැලුව මානැවි!

යමක් සකසනවා යැ කියන්නේ එය උඩුකුරු කොටැ යටිකුරු කොටැ බලා සිඳැ-බිඳැ-ලීම යි! මෙ විදියට ගෙයක් සකසනවා යැ කියන්නේ ඒ ගෙය මතැ දෙපා රඳවා නැඟීසිටැ එය උඩු යටිකුරු කොටැ බලා සිඳැබිඳැලීම යි! මේ අනුවැ පැරැණි සම්ප්‍රදයය උඩැ කකුල් දෙක තබාගෙනැ නැඟී සිටැ එය උඩුකුරු යටිකුරු කොටැ බලා සිඳැ බිඳැ ලීම යි එය සැකැසීම නම්. කදිම යි සැකැසීම!

'සම්ප්‍රදයය අනුගමනය කිරීමෙන් කුමාරතුංග ආදීන් රස කවි ලියූ බව මුලින් කියැවිණි. අගින් කියැවෙන්නේ රස කවි ලිවීමට නම් කිවියා සම්ප්‍රදයය කඩ කඩ කළ යුතු බව යි. 'අසුවල් ගොවියා කෙතේ වැටකටු රැකීමෙන් හොඳ අස්වැන්න ඉපැද්දුවි යැ. ගොවියන් හොඳ අස්වැන්න ලැබීමට කළ යුත්තේ ඒ නිසා කෙතේ වැට කටු සිඳ්‍ද-බිඳ්‍දලීම යි යන්න වැන්නක් කීවා නම් මෙයටත් වඩා මනහර යැ!

කුමාරතුංගයෝ සම්ප්‍රදයය අනුගමනය කළ කෙනෙකි. එ හෙයින් ඔවුන් ගේ කවි, රස දනවනසුලු විය. (අළගියවන්නයෝ ද සම්ප්‍රදයය නොකඩ කළ කෙනෙකි.) එහෙත් අළගියවන්න වැනි දෙවෙනි ගණයේ කවියකු සතු ධී ශක්තිය වත් කුමාරතුංගට නොතිබුණි! කො තරම් 'තර්කානුකූල' කියමන් ද මේ!

මෙ බඳු කියුළු ලියුම් දකින විටැ අපට නම් සිතෙන්නේ ගුණදස අමරසේකරයන් ගේ පියෙව් සිහිය ගැනැ සැකයෙකි!

'කුමාරතුංග භාෂා විශාරදයකු වීමට ගොස් උවමනාවෙන් ම කවි ශක්තිය වනසා ගත්තේ ය' යනු අමරසේකරයන් ගේ තව ද සොයාගැනීමෙකි.

''කුමාරතුංග භාෂා විශාරදයකු නුවූ බව ද අමරසේකරයන් මින් හඟවනුයේ? භාෂා විශාරදයකු වීමට ගොස් යනු එකෙකි. භාෂා විශාරදයකු වීමෙන් යනු අනෙකෙකි. ගමනක් යෑමට ගොස් ඉහ් අතමිට නැති කැරැගත්තේ යැ යනුත් ගමනක් ගොස් ඉහ් අත මිට නැති කැරැගත්තේ යැ යනුත් දෙකෙක් මැ යැ ; සැබැවින් මැ භාෂා විශාරදයකු ගේ කැරුම් විවිසීමට කෙසේ වුවත් පුවත් පතකට ඇද හැරැ ලිපියක් ලිවීමට එ තරම් භාෂා විශාරද කමෙක් ඇවැසි නො වේ!

ඇත්තට මැ 'කුමාරතුංගයන් භාෂා විශාරදයකු වීමට ගොස් කවි ශක්තිය වනසාගත්තා නම් ඔහු රස කවි ලියූ හ යි මුලින් කියැවුණේ ඒ රස කවි ලියැද්දී කවි ශක්තිය පැවැතුණු නිසා වත් ද? නැත හොත් මුලින් ඔබ කී දැ පසු වැ ඔබට නොමතක වූ නිසා ද?

හොඳා, එ සේ කවි ශක්තිය විනාශ කැරැගත්හ යි නිකම් මැ 'සිද්ධාන්තයක්' මතු කළා විනා කෝ එක් නිදසුනක් වත් දක්වූවා? නිදසුන් නො දී ''ඒ කව අසාර්ථක යැ. මේ කව සාර්ථක යැ යි කීමට පේරාදෙණි වල්ලේ විවිසුවෝ අතිමසත්තු යැ. ඒ යැ සරසවි විනය (Academic Decipline) නම්!

දැන් අපි මාර්ටින් වික්‍රමසිංහයන් ගේ මේ කියමන යළි සැලැකිල්ලට ලක් කරමු.

''වියරණය හා බස් වහර යන දෙක ම ධී ශක්තිය ඇති කවියා ගේ වහලකු මිස ස්වාමියෙක් නො වේ.''

සූත් සිහියන් ගේ කියමන් පසකට ලා විකුම් සිහියන් ගේ මේ කියමන මැ සලකමු නම් මේ යුගයෙහි පහළ වැ සක්විති වැ බස හැසිරවූ මහ කිවියා කවරෙක් ද යනු පැහැදිලි යැ.

නීතිය – 6

මහේස්ත්‍රාත් උසාවියේ පැවැත්වෙන මූල් පිරික්සුම

–– දම්මිත්

මහෙස්ත්‍රාත් උසාවියේ මූල් පිරික්සුමකට ඉඩ ඇත්තේ දිස්ත්‍රික් උසාවියෙන් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් හෝ දඬුවම් නියම කළ යුතු වැරැදිවලට පමණි. පිරික්සුම් පිළිවෙළ අපරාධ විධාන සංග්‍රහයේ 16 වැනි පිරිසිදියෙන් විතර වේ.

මූල් පිරික්සුම පැවැත්වෙනුයේ කුමන චෝදනා ගැනැ දැ යි විත්තිකරු පළමුයෙන් දැනැ-ගත යුතු වේ. එ හෙයින් මහෙස්ත්‍රාත්වරයා විසින් චෝදනා කියවනු ලැබීම මෙහි පළමු අදියර යි. චෝදනා ඉදිරිපත් කැරුණු විටැ විත්තිකරු පිළිතුරු වශයෙන් කිසිවක් කිව යුතු නැති. ඒ බව අපරාධ විධාන සංග්‍රහයේ 156 වැනි කැඩියෙහි කියැවේ. විත්තිකරු විසින් පිළිතුරක් කියැවුණ ද එය මහෙස්ත්‍රාත්වරයා විසින් සටහන් නො කැරේ. එ වැනි පිළිතුරක් විත්තිකරුට විරුදු වැ සාක්කියක් හැටියට ද ඉදිරිපත් කළ නොහැකි යැ. මේ සියල්ල මැ නීතියෙන් සලසා ඇත්තේ විත්තිකරුට අයුත්තක් නොවනු පිණිසැ යැ.

සාක්කි සටහන් කැරුම මීළඟ පියවර යි. මෙය විත්තිකරු ඉදිරි පිටැ කළ යුතු වේ. සාක්කිකරුවෝ නඩුවට බඳුන් වී ඇති සිද්ධිය ගැනැ කරුණු දන්නා අය වියැ යුත්තෝ යැ; ඔවුහු දිවුරුම් පිටැ සාක්කි දියැ යුත්තෝ යැ. සාක්කිකරුවන් ගේ පැවැසුම් මහෙස්ත්‍රාත්-වරයා විසින් සටහන් කරනු ලැබේ. තමනට විරුදු වැ ඉදිරිපත් කැරෙන සෑම සාක්කි-කරුවකු ගෙන් මැ පැන ඇසීමට විත්තිකරුට අයිතියෙක් ඇති. පැනවලට සාක්කිකරුවන් දෙන හැම පිළිතුරක් මැ ඔවුන් ගේ පැවැසුම්වලැ කොටස් හැටියට සටහන් කැරේ. සැමැති විසින් විත්තිකරු වෙනුවෙන් පැන අසනුයේ ඔහු ගේ නීතිඥයා යි. එහෙත්, ඔහු වෙනුවෙන් නීතිඥයෙක් පෙනී නො සිටී නම්, පැමිණිලි පසේ එක් එක් සාක්කි-කරුවා සාක්කි ඉදිරිපත් කළාට පසු, ඔහු ගෙන් පැන ඇසීමට කැමැති දැ යි මහෙස්ත්-රාත්වරයා විත්තිකරු ගෙන් ඇසියැ යුතු යැ.

පැමිණිලි පසේ සාක්කිකරුවන් ගේ සාක්කි ඉදිරිපත් කැරුණු පසු, මීළඟ පියවර එළැඹේ. විත්තිකරුට විරුදු වැ සෑහෙන කරුණු ඇද්ද නැද්ද යනු මහේස්ත්‍රාත්වරයා විසින් තීරණය කැරුම යි ඒ. සෑහෙන කරුණු නැති නම් විත්තිකරු නිදහස් කිරිමට අණ දීමට මහේස්ත්‍රාත්වරයාට බලය තිබේ. 'අපරාධ විධාන සංග්‍රහයේ' 162 (1) කැඩීයෙන් මේ අවසරය ලැබේ. එහෙත් කලින් ඉදිරිපත් කරන ලද චෝදනාවට හේතු වූ කරුණු මතැ මැ ගොඩනැඟුණු චෝදනාවක් විත්තිකරු වෙතැ පසු වැ ඉදිරිපත් කිරීමට මෙයින් අවහිරයෙක් නො වේ. කෙටියෙන් කිව හොත් මේ කරුණු මතැ දෙ වන වරක් නඩු පැවැරීමට නීති-යෙන් ඉඩ ඇත්තේ යි. එ හෙයින් 162 (1) කැඩියෙන් කැරෙන්නේ නිදහස් කිරිමක් මිසැ නිදෙස් කිරීමෙක් නො වේ.

සෑහෙන කරුණු ඉදිරිපත් වී ඇතැ යි පෙනිගිය හොත් මහෙස්ත්‍රාත්වරයා විසින් නැවැත වරක් විත්තිකරුට චෝදනාව කියවනු ලැබේ. චෝදනාවෙන් කියැවෙන දැ සැමැති විසින් විතර කැරුණු පසු ඔහු වෙනුවෙන්

සාක්ෂි දීමට සාක්ෂිකරුවන් ඉදිරිපත් කළ හැකි බව මහෙස්ත්‍රාත්වරයා විත්තිකරුට කියයි.

පිරික්සුමෙ හතර වැනි අදියර වසයෙන් ඇත්තේ විත්තිකරු ගේ පැවැසුම සටහන් කිරීම යි. එහෙත් පැවැසුමක් කිරීමට විත්තිකරුට නීතියෙන් බල නො කැරේ. කැමැති නම් පැවැසුමක් කළ හැකි බවත්, ඒ ගැනැ නීතියෙන් බල නොකැරෙන බවත්, කරන හැම පැවැසුමක් මැ නඩුවේ දී සාක්ෂි හැටියට පාවිච්චි කරන බවත් මහෙස්ත්‍රාත්වරයා කියයි.

විත්තිකරු පැවැසුමක් කිරීමට ඉදිරිපත් වේ නම්, එය ලියා තබන පිළිවෙළ අපරාධ විධාන සංග්‍රහයේ 302 වැනි කැඩියෙන් විතර වේ. විත්තිකරු පැවැසුම කරන බසින් මැ එය සටහන් කළ යුතු වේ. එ සේ කළ නොහැකි නම් ඉංගිරිසියෙන් සටහන් කළ හැකි යැ. මෙ සේ සටහන් කැරැ ඇති පැවැසුම විත්තිකරුට පෙන්වියැ යුතු යි; නැතහොත් ඔහුට කියැවියැ යුතු යි. ඉංගිරිසියෙන් ලියැවී ඇති විටැ එහි අඩංගු කරුණු විත්තිකරුට කියා දියැ යුතු යි. මහේස්රාත්වරයා විසින් මේ කිස ඉටු කැරුණු පසු ඔහු ගේ පැවැසුමේ ඇතැම් තැන් වෙනස් කිරීමට හෝ තවත් විස්තර එකතු කිරිමට හෝ විත්තිකරුට ඉඩ තිබේ. ඉන් පසු විත්තිකරු ගේ පැවැසුම තමා ඉදිරි පිටැ දී කැරුණු බවත් එ මැ පැවැසුමට විත්තිකරු කී දැ ඇතුළත් කැරැ ඇති බවත් සහතික කරමින්, මහේස්ත්‍රාත්වරයා ඔහු ගේ අත්සන තැබියැ යුතු යැ. ඉන් පසු විත්තිකරු ද එයට අත්සන් තැබියැ යුතු වේ. අත්සන් කිරීමට බැරි බව ඔහු දන්වුව හොත් ඒ බව මහේස්ත්‍රාත්වරයා සටහන් කළ යුත්තේ යි.

ඊ ළඟට තමා සාක්ෂි දීමට හෝ සාක්ෂිකරුවන් ඉදිරිපත් කිරීමට හෝ කැමැති දැ යි විත්තිකරු ගෙන් ඇසේ. තමා එ සේ කිරීමට නොඑළැඹෙන බව මහේස්ත්‍රාත්වරයාට දන්වීම බොහෝ විත්තිකරුවන් ගේ සිරිති. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබියැ දී, සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් විත්ති පස නිදහසට දක්වන කරුණු කෙ බඳු දැ යි පැමිණිලි පස දැනැගන්නා හෙයින් සාක්ෂි ඉදිරිපත් කිරිම නුවණට හුරු නැතැ යි බොහෝ විටැ විත්ති පස කල්පනා කරයි.

සාක්ෂිකරුවන් නො කැඳවා තමා පමණක් සාක්ෂි දීමට කැමැති යැ යි විත්තිකරුවකු කියා සිටියැ හොත් මහේස්රාත්වරයා එයට ඉඩ දෙනු ඇති. සාක්ෂි සටහන් කිරීමෙන් පසු, ඔහු වෙනුවෙන් පෙනී - සිටින නීතිඥයාට ද කතා කිරීමට ඉඩ ලැබේ.

විත්තිකරු ගේ සාක්ෂිය හැරැ වෙනත් සාක්ෂිකරුවන් ද ඉදිරිපත් කිරීමට හෝ සාක්ෂිකරුවන් ඉදිරිපත් කොටැ තමන් සාක්ෂි දීමෙන් වැළැකිමට හෝ විත්තිකරු කැමැත්ත පළ කළ හොත් පළමුවෙන් ඉඩ ලැබෙනුයේ විත්තිකරු ගේ නීතිඥයා කරන දෙසුමට යි. මීළඟට විත්තිකරු ගේ සාක්ෂිය ඇසේ. සාක්ෂිකරුවන් ඉදිරිපත් කැරෙනුයේ ඉන් පසු වැ යි. විත්තිකරු සාක්ෂි නො දෙන්නේ නම් සාක්ෂිකරුවන් ඉදිරිපත් කැරෙන්නේ දෙ වැනි වැ යි.

සාක්ෂිකරුවන් උසාවියට පැමිණැ නැති නම් ඔවුන් වෙත සිතාසි නිකුත් කැරැ නැති නම් වෙන යම් ක්‍රමයෙකින් ඔවුන් උසාවියට පැමිණීම බල කැරැ, පිරික්සුම වෙන දිනයකට කල් දැමීමට නීතියෙන් ඉඩ තිබේ. එහෙත් ඒ වැනි පියවරක් ගැනීමට මහෙස්ත්‍රාත්වරයා එළැඹෙන්නේ කරුණු දෙකක් පැහැදිලි වුව හොත් පමණි.

(1) සාක්ෂිකරුවන් නොපැමිණීම විත්තිකරු ගේ නොසැලැකිල්ලෙන් හෝ වරදින් හෝ සිදු නොවූ බව.

(2) නො පැමිණැ-සිටි සාක්ෂිකරුවන් විත්තිකරු වෙනුවෙන් වැදගත් සාක්ෂි ඉදිරිපත් කළ හැකි බව.

මෙ අවස්ථාවේ දී ඉදිරිපත් කැරෙන සාක්කි සියල්ලක් මැ සටහන් කැරැ-ගත යුතු වේ.

සෑහෙන තරම් සාක්කි ඇති විටැ විත්ති කරු දිස්ත්‍රික් උසාවියට හෝ 'ශ්‍රෙෂ්ඨාධි-කරණයට' හෝ ඉදිරිපත් කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා නියම කරයි. මහේස්ත්-රාත් උසාවියේ පැවැත්වෙන මුල් පිරික්සුමට පසු නඩුව ඇසෙන්නේ කවර උසාවියෙකැ දැ යි තීරණය කිරීම අපහසු නො වේ. අපරාදවලැ නම් ඉද්දකුත් ඒ අපරාද පිළිබැඳි නඩු විසැඳියැ හැකි උසාවිත් 'අපරාධ විධාන සංග්‍රහයේ' දක්වා ඇත්තේ යි. දිස්ත්‍රික් උසාවියේත් මහේස්ත්‍රාත් උසාවි-යේත් අධිකරණ බලයට යටත් වන වැරැදි ඇති. ඒ වැරැදි සබඳින් නඩු ඇසීම පැවැරියැ යුත්තේ කවර උසාවියකට දැ යි තීරණය කිරීමට මහේස්ත්‍රාත්වරයාට නිදහස ඇත්තේ යි.

දිස්ත්‍රික් උසාවිය හෝ ශ්‍රෙෂ්ඨාධිකරණය හෝ වෙතැ ඉදිරිපත් කිරිමේ අණ දීමේ දී, මහේස්ත්‍රාත්වරයා විත්තිකරු ගෙන් විමැසියැ යුත්තෙක් ද වේ. එ නම් නඩුවේ දී තමා වෙනුවෙන් සාක්කි දීමට කැඳවන අය ගේ නම් ලයිස්තුවෙකි. සාක්කිකරුවන් ගේ නම් එ තැනැ දී මැ කිව යුතු වේ. නඩුව සබැඳි කරුණු ගැනැ සාක්කි ඉදිරිපත් කරන අයත්, විත්තිකරු ගේ චරිතය ගැන සාක්කි ඉදිරිපත් කරන අයත් වෙන් කොටැ දැක්වියැ යුතු බව ද මහේස්ත්‍රාත්වරයා විසින් විත්තිකරුට කියනු ලැබේ.

විත්තිකරු වෙනුවෙන් මුල් පිරික්සුමේ දී සාක්කිකරුවන් ඉදිරිපත් කොටැ ඇති නම්, මහේස්ත්‍රාත්වරයා විසින් මීළඟට කැරෙනුයේ විත්තිකරු විසින් දෙන ලද සාක්කිකරුවන් ගේ ඉද්දෙන්, සාක්කි නුදුන් අය තෝරා ඔවුන් ගේ ඉද්දක් පිළියෙළ කිරීම යි. නියම කැරැගත් දිනයෙකැ, නඩු අසන උසාවියේ පෙනී සිටින ලෙස ඔවුනට දැන්වීම් යවන මෙන් මහේස්ත්‍රාත්වරයා පිස්කල් තැනට අණ දෙනු ඇති. යම් විදියෙකින් සාක්කිකරුවකු නියම දිනයට නො පැමිණිය හොත්, ඔවුනට යවන ලද දැන්වීම සිතාසි හැටියට සලකා මීළඟට කටයුතු කරනු ලැබේ.

විත්තිකරු විසින් දෙනු ලබන සාක්කිකරු ඉද්දේ ඇතැම් සාක්කිකරුවන් නඩුවට ඇවැසි කරුණු ගැනැ සාක්කි දෙනැ යි සිතීමට හේතු නැතැ යි මහේස්ත්‍රාත්වරයාට හැඟීගිය හොත් ඒ තැනැත්තන් ගේ නම් ඉද්දෙන් ඉවත් කිරීමට ඔහුට බලය ඇත්තේ යි.

පැමිණිලි පසේ හෝ වේ වා විත්ති පසේ හෝ වේ වා තමා ඉදිරියේ සාක්කි දී ඇති, නඩුවට ඇවැසි, හැම සාක්කිකරුවකු මැ ඉහළ උසාවියේ දී පැවැත්වෙන නඩුවට හෝ නීතිපතිවරයා විසින් මෙ ගැනැ පැවැත්වියැ හැකි වැඩි දුර සෝදිසියකට හෝ පෙනී සිටින බවට සහතික කරන බැඳුම්කරයකට (Bond) අත්සන් තැබියැ යුතු යැ යි අණ කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලය තිබේ.

සාක්කිකරුවකු බැඳුම්කරයකට අත්සන් කරන්නට නොකැමැති වුව හොත්, නැති නම් අත්සන් කිරීමෙන් වැළැකී සිටියොත්, මහේස්ත්‍රාත්වරයා කරන්නේ කිමෙක් ද? 'අපරාධ විධාන සංග්‍රහයෙහි' 165 A (3) කැඩිය යටතේ එ මැ තැනැත්තා හිර අඩස්-සියට නියම කිරීමට මහේස්ත්‍රාත්වරයාට පිළිවනි. බැඳුම්කරය අත්සන් තබන තුරු හේ සිර අඩස්සියේ තැබේ. නඩු දිනය එළඹෙන තෙක් ඔහු බැඳුම්කරයට අත්සන් තබා නැති නම්, සාක්කි දීම සඳහා හේ සිර භාරයේ සිටැ ඉදිරිපත් කැරේ.

ඉහළ උසාවියෙකැ දි විසැඳුම සඳහා නඩුවක් ඉදිරිපත් කරන විටැ, නඩුවේ ජූරියේ ඇත්තන් සිංහල කතා කරන හෝ ඉංගිරිසි කතා කරන හෝ අය දැ යි තේරීමට විත්තිකරුට අවසරයෙක් ලැබේ.

විත්තිකරු ඉහළ උසාවියට ඉදිරිපත්කළ යුතු යැ යි මහේස්ත්‍රාත්වරයා තීරණය කළාට පසු, පිරික්සුමේ වර්තාවෙකැ පිටපතක් ලබාගැනීමට විත්තිකරුට අයිතියෙක් තිබේ. ඔහු ඒ පිටපත ඉල්ලියැ යුත්තේ නඩුවට සෑහෙන කලක් තිබියැ දී යැ. එ මැ පිටපත වාර්තාව බාර නිලදරුවා ගෙන් ලබාගත හැක්කේ වචන සියයකට සත හය බැගින් ගාස්තුවක් ගෙවීමෙන් යැ. එහෙත් පිටපත සඳහා කිසිවක් ගෙවීමෙන් විත්තිකරු නිදහස් කිරීමට මහේස්ත්‍රාත්වරයාට, හෝ නඩුව ඇසීමට පැවැරී ඇති ඉහළ උසාවියේ විනිසකරුට හෝ පිළිවනි. අවසනැ සඳහන් කැරුණු තැනැත්තාට එ වැනි අණක් දියැ හැක්කේ නඩුවේ වාර්තාව ඒ උසාවිය වෙත යැවුණු පසු, විත්තිකරු විසින් ඉල්ලුම් කැරුණොත් පමණි.

පිරික්සුම අවසන් කළ පසු මහේස්ත්‍රාත්වරයා විසින් කළ යුත්තේ, තමා විසින් සහතික කැරුණු පිරික්සුම් වාර්තා පිටපතක් නීතිපති වෙත යැවීම යි. ලියැකියැවිලි හැරැ නඩුවේ දී ඉදිරිපත් කළ යුතු අනෙක් සියලු මැ දේවල් පිස්කල් තැන වෙත යැවීම ද ඔහු විසින් කළ යුතු වෙයි.

මහේස්ත්‍රාත්වරයා ගේ වාර්තා බැලීමෙන් පසු, පිරික්සුමේ දී නිදහස් කැරුණු විත්තිකරු වැඩි දුර පිරික්සුමට ලක් කිරීමට හෝ නඩු පැවැරීම සඳහා ඉහළ උසාවියට ඉදිරිපත් කිරීමට හෝ අණ කිරීමට නීතිපතිවරයාට බලය තිබේ. පිරික්සුමෙන් පසු ඉහළ උසාවියකට ඉදිරිපත් කැරුණු විත්තිකරුවකු නිදහස් කිරීමට ද නීතිපතිට පිළිවනි. සාක්කි නො සෑහෙතැ යි හැඟුණ හොත් තවත් සාක්කි සටහන් කිරීමට අණ කිරීම නීතිපති විසින් කළ හැකි යි. මේ හැරැ පිරික්සුමක් පැවැත්වෙන අතරේ දී මහේස්ත්‍රාත්වරයාට උවදෙස් දීමට ද ඔහුට බලයෙක් ඇති.

දිස්තිරික් උසාවියේ දී ඇසියැ යුතු නඩුවක් මහේස්ත්‍රාත් උසාවියේ දී අසා නිම කළ හැකි බව 'අපරාධ විධාන සංග්‍රහයෙහි' දක්වා තිබේ. එහෙත් එ වැන්නක් සඳහා විත්තිකරු ගේ කැමැත්ත ලබාගත යුතු වේ. විත්තිකරු ගේ සිරිත ඔහු කැරැ ඇති අපරාදයෙහි තතුව යනාදිය සලකා බලා මෙ වැනි තීරණයක් ගැනීමට මහේස්ත්‍රාත්වරයා වෙත බලය පවරා තිබේ. එ වැනි නඩුවක් මහේස්ත්‍රාත් උසාවියෙකැ අසා නිම කළ හැකි නඩුවෙකැ 'ස්වරූපය' ගනී. දෙළොස් මසකට නොවැඩි සිර දඬුවමක් හා රුපියල් සියයකට නොවැඩි දඩයක් මෙ වැනි නඩුවලැ දී නියම කළ හැකි යැ. මේ දඬුවම් දෙක මැ හෝ එකක් හෝ තෝරා නියම කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලය තිබේ.

පැදි තරගය

මැය – යුදට ගිය සැමියා සිහි කරමින් මව පුතු නැළැවූ පරිදි.

තෑගි දෙන්නෝ – ගල්කිස්සේ, සාන්ත තොමෝසු විදුහලේ ඇදුරු ඩැයිරස් කුමාරසිංහ සූරීහු යැ

ඔබේ පබඳ දෙසැම්බර මස නො ඉක්මවා, ගල්කිස්සේ හුළුදගොඩ පාරේ 20/1 හි එඩියේ සකසුවන් වෙත එවන්නැ.

පහදුව

1. උලෙළ ද? උලෙළ ද?
පහදන්නැ

— වෙ. අමරදස

උණුවටුන.

දෙක මැ නිවරද යැ.

ලෙළඹී ලෙළ, ලෙල සේ මැ ලොළ, ලොල ද පවතු (ධාතු) වෙයි.

උසස් වැ ලෙළෙනුයේ උලෙළ යි, උළෙල යැ යි ද සිටී. [උ+ලෙළ> උලෙළ = උළෙල]

උසස් වැ ලොළනුයේ උලොළ යි, මේ පැරැණි වහර යි.

දෙ තන්හි මැ 'උ' උපසග යි. —සකසු]

2. පින්වත් සකසුවාණෙනි, කුමරතුඟු මුනිඳසුන් ගේ 'ඇගේ පැමිණිල්ල,' යන මැයෙන් කළ පබඳ පළ කරවා එහි අරුත් ද පහද-දුන මැනැවි.

— සුදත් වීරකෝන්

උණුවටුන.

[එ පැදි පෙළ පළ වෙයි. ඔබට එහි ගැට තැන් ඇත විමසන්නැ. — සකසු]

3. සකසුවාණෙනි, ඔබට පින් දෙමි ගිය කලබෙහි මා වෙනුයෙන් සැපැයූ හෙළ වදන් තිහිපයට. පහතැ පෙනෙන වදන් සුහට ද ඔබ ගේ පහදුව වේ වා!

— සුනන්ද ජයවර්ධන

ගල්කිස්ස

[ඔබේ වදන් ද අප සලකවන වදන් ද මේ යැ. —සකසු]

Basket Ball - පැස-වට (කෙළිය)
Badminton - පෙඳ-වට (කෙළිය)
- (පෙඳ නම් පියාපත් යැ.)
Fives - බිතු-වට (කෙළිය)
Tennis - දැල් පිනි (කෙළිය)
Hockey - වක් පිනි (,,)

4. මම රජයේ අදිකාරියෙක බස් පෙරළන්නෙක්මි. සකු ඈ පර වදන් යෙදූම නොකැමැත්තෙමි. පහතැ දක්වේන පර වදන් (සකු, ඉංගිරිසි ඈ) වෙනුවට හෙළ වදන් එළිය මගින් පළ කරන්නේ නම් ඔබට පින් දෙමි.

කොළොඹ. — බස් ලැදි

[අප සලකවන වදන්, ඔබ එවා ඇති වදන් ඉදිරියේ පහතැ පළ වෙයි. —සකසු]

උපලේඛනය - උපලිපිය
විභාගය - විබෙදුව, සෝදිසිය
සාකච්ඡාව - සැසැඳිල්ල
ආඥා පනත - අණ පනත
සාමාන්‍යයෙන් - සැමැනි විසින්; සැමැනියෙන්
ස්තුතිවන්ත වන්නෙමි - පින් පවරමි
කෘතඥ වන්නෙමි - ගුණ තකමි
ප්‍රාදේශීය ආදායම් නිලධාරි - පෙදෙසි අය නිලදරි
කාර්යාලයය - කම්දෙරුව
සිතාසි - අණකැඳැවුම
සිතාසි නිකුත් කරනවා - අණකැඳවනවා
Write - ලියා යැවීම
Irrecoverable - යළි නො ලැබියැ හැකි
Fiscal - අණදරි
Return of Post - හැරෙන-පහිණයෙන් (තැපෑලෙන්)
Trial - හරික්සුව
[හරි + ඉක්සු>හරික්සු; හරි දැ යි බැලීම]
Enquiry - සෝදිසිය
Procter - නියැදුරු
Nett (amount) - මුළු ගණන
Warrent - වරාණ (වරයක් සඳහා දෙන අණ. වර + අණ>වරාණ)
Writ - ලිවි
Executor - කාරියකරවන්නා
Executive - කාරියකරවන

5. එළියේ වජ් කලබෙහි ඉපැරැණි හිරු ගියෙක් දක්විණි. එයට අරුතුදු දක්විණි. එහි අපට ගැටයෙකි. එහි දේස් යනු දෙන්නැ යි ද වළවයි යනු රැස් වවු යැ යි ද අරුත් දක්විණි. ඔබ අරුත් ගත්තේ කොයින් ද? කවර වියරණයක් අනුවැ ද?

බද්දෙගම — ල. අමරසේකර

[මේ ඉපැරැණි හෙළ පද යි. ඒ අද වියරණයෙන් පහදලීම උගහට යැ. එහෙත් ඉහතැ කී ඉපැරැණි බස් වහර මැනැවින් පිරික්සා බලා තරමක් සැක පිටැ ඒ අරුත් පැදුමු.

දේස් – මෙ දේස් යනු ආසී කිරිය පදයෙකැ යි අපි සලකමු. දේ වා යනු යැ අද වහර. දේ වා යන තන්හි දේ යනු හුදු කිරිය යි. වා යනු ආසී අරුත් පස යි. එහෙත් ඉපැරැණි පදයක් වූ දේස් යනු අද 'දේ' යන්න සලකා යෙදුණු සේ යැ. දේ මැ දේස් යැ. දේ + අස් > දේස්. අද නම් මේ අස් යනු වරලස් (වරල් + අස්) වෙරලස් (වෙරල + අස්) ඈ තන්හි යෙදෙන නම්දුනු (තද්ධිත) නිපා පසෙකි. එහෙත් එ ද ඒ කිරියදුනු (කෘදන්ත) නිපා පසක් අයුරින් ද යෙදුණු සැටියෙකි. පැරැණි වහරේ අස් යනු නම්දුනු, කිරියදුනු දෙකට මැ එක් බඳු වැ යෙදුණු පසක් බවට ද දෙස් ඇති. ඉපැරැණි පදයක් වූ 'යද්දෙස්සා' යනු විමසා බලන්නැ. 'යාස් + දේස් + සා' වහරින් යද්දෙස්සා වූ සේ යැ.

යාස් නම් යහපත යි. යහ මැ . යහස් (යහ + අස්) > යාස් යැ. දේස් නම් 'දේ වා!' යන්න යි. සා (සව් > සා) නම් සියල්ලනට යන්න යි. සෙත් (සාන්ති) කම්හි දී සියල්ලනට යහපත දේ වා යි පතන්නා යැ (යාස් + දේස් + සා) යද්දෙස්සා නම්. මේ 'යාස් දේස් සා' යනු අද වහරින් 'ආයිබෝ වේ වා' යන්න යි. එ සේ පතන්නා ද එ නමින් මැ යද්දෙස්සා වූ සේ යැ. මෙ නියරින් වූ නව ද වදන් ඇති.

මෙහි නම්දුනු (තද්ධිත) නමුවක් වූ යාස් යනු මෙන් මැ යකැදුරු බස් වහරේ ඔව්, යහපති යන අරුත්හි එන යේස් යනු මෙ බඳු මැ අනෙක් නව නමෙකි. යෙහෙ මැ යෙහෙ + අස් > යෙහෙස් > යේස්.

ආසී කිරිය පදයක් වූ දේස් යනු දෙන්නැ යනුයෙන් ගිය එඩියෙහි අරුත් පැවැසුණ ද දෙන්නැ යනු සඳහා ඉපැරැණි වහර නම් දේන් යනු යැ. "ගොරක දේන්, දේන්, දේන්" ඈ ගී පෙළෙහි එන ඒ දේන් යනු අද දියන් යන වහරට බෙහෙවින් සම යැ. එ හෙයින් දේස් යන්නට දෙන්නැ යි **දුන් අරුතට** වඩා දේ වා! යැ යි දක්වූවා නම් වඩා මැ මැනැවැ යි හඟිමු. මතුරැ සතරැ නම් මේ අරුතෙහි දේස් නො තෙකුත් ලැබේ.

වළවයි – මෙයට අප අරුත් කීයේ රැස් වවු යනුයෙනි. එ කලැ වළවයි යනු විදි කිරිය පද යි.

මේ වළවයි යන්න සේ මැ මෙ කිරිය-මුලින් මැ නැඟුණ හ යි සිතියැ හැකි නව ද කිරිය පද අදත් වහරේ රැකී ඇති බව පෙනෙයි. වල්වවූ[1], වාළෝ[2] යනු එ බඳු පද දෙකෙකි. එහෙත් වල්වවූ මෙන් මැ **වළවයි**[3] යනු ද විදි කිරිය පදයක් බවට ඉපැරැණි වහරින් මැ පෑ හැකි නව ද දෙස් බෙහෙවි, වල්වා යනු මෙහී පෙර කිරිය රුව යි.

රැස් වීමෙහි 'ඔසර' යන පවතුව නිපදවන ඔසළ, ඔසළෝ ඈ වදන් අද ද අප ගේ පත පොතෙහි පෙනේ. මේ ඔසළ ඈ රූ නිපදවන ඔසර පවතුව සේ මැ වළ (සල) ඈ රූ නිපදවන වර (සර) පවතුවක් අපට වූ සැටියෙකි. වදන් ඔවදන් වූ තන්හි මෙන් මේ සර, ඔ උපසග හා බැඳී ඔසර වෙයි.

මේ ඈ නව ද විමැසුම් පතයි. — **සකසු**]

* * *

ඉපැරැණි කෙළි ගීයෙකි

රෝ දැ, රෝ දැ—
මල් වළා
තිර් මන්නෙයි වා—
ළෝ, වාළෝ

පෙළගැස්ම - රෝ දැ (හිරු දූයේ — ජාතියේ) රෝ දැ (හිරු දූයේ — ජාතියේ) [වූ] මල් (මලුන් — මල්ලිලා — ගේ) වළා (වළල්ල — වටය) තිර් මන්නෙයි (තිර මන් — දැඩි සිත්— [ඇති] කරනුව) වාළෝ (රැස් වූ හ) වාළෝ (රැස් වූ හ.)

විතර - රෝ — මේ හිරු අරුත්හි යැ. මෙ අරුත්හි රා, රෝ දෙක මැ යෙදුණු බව පෙනේ.
තිර් මන්නෙයි — තිර් + මන් + හෙයි > තිර් මන්නෙයි. හෙයි යනු හෙයින් (හේතුයෙන්) යන අරුත් දුන් සේ යැ, ඉපැරැණි වහරෙහි.

ඉල් මස

වපුරන මස වප් මස බව ගිය මසැ එළියෙන් පැහැදිලි කැරිණි. මේ එනුයේ ඉල් මස යි.

වප්-ඉල් සරා කල් වේ'යැ යි පැරැකුම්බාවෝ ඒ දෙ මස මැ සරා උතුයෙහි (ශරත්-ඍතුයෙහි) ඇතුළත් කළ හ, [රුවන් මල-84 පැදිය]. පොළෝ අරුත්හි ඉල් යන්නක් ගැනැ ද රුවන් මල පවසයි. (164 පැදිය). එහෙත් ඉල් මස යන තන්හි ඉල් යනු ඒ පොළෝ අරුත නො වියැ හැකි. ඒ සේ නම් ඉල් යන්නෙහි අරුත කවරේ ද?

ඉල් පණුවා, ඉලපත, ඉලතටුව (ඉලත්-තට්ටු) කොපිල්, පිල්, නිල් ඈ, ඉල් යන්න හා බැඳුණු සේ පෙනෙන වදන් රැසෙක් මැ ලැබේ. ඒ එකක් එකක් ගෙනැ අරුත් විමසා බැලීම මේ ඉල් යන්නෙහි නියම අරුත් පාදගැන්මෙහි උදව් වෙති යි සිතමු.

ඉල් පණුවා නම් ඉල් මසෙහි ඇති වන පණු (දලඹු) වෙසෙසෙකි. උගේ නමින් මස ඉල් වූවා නො වැ එ මසේ බෝ වන හෙයින් ඌ 'එ නම්' වූ සේ සැලැකීම නිවැරැදි යැ යි සිතමු. ඇසළ මසැ මල් හට ගන්නා ගසක් ඇසළ වූයේ ද, බිණර මල් නත්තල් ගස්, ජනෝරු මල් ඈ නම් වූයේ ද, මේ අයුරිනි. එ හෙයින් ඉල් පණුවා යන තන්හි එන ඉල් යනු ද ඉල් මසැ යන තන්හි එන ඉල් යනු ද එක මැ මුල් අරුතෙකැ ලා බැදෙන සේ සැලැකියැ යුතු වෙයි.

ඉල් පණුවා දළඹුවෙකැ යි පෙරැ මැ කීමු. උගේ අහර කොළ යැ. ඌ වසන්නේත් කොළවලැ මැ යැ. එ හෙයින් ඉල් යන්නෙහි මුල් අරුත කොළ යන්න දූ යි අපි සැක කරමු.

ඉලපත නම් කිමෙක් ද? ඉන් කැරෙන කටයුත්ත අද ද හැඳින්වෙන්නේ අතුගෑම නමිනි. එ හෙයින් ඉලපත මුල් අවදියේ දී-එයට එ නම වැටෙන අවදියේ දී - අතු කැබැල්ලක් මැ වූ බවට සැක නැති. එයත් කොළ ඇති අතු කැබැල්ලත් මැ වියැ යුතු. එ සේ කියන්නේ කොළ නැති අතු රිකිල්ල ඒ අරුතින් මැ ඉදල් (වි+දල්) නමින් වහර වී මිඳුල, වත්ත පිටිය ඇමැදීමට යෙදුණු හෙයිනි. එ හෙයින් ගෙ තුළ අතු ගෑමට යෙදුණු ඉලපත් නම් කොළපත් මැ යි. ඉල් යනු කොළ අරුත්හි වූ බව මින් පෙනේ.

ඉලතටුව නම් අද වහරේ හැටියට බුලත් තටුව යි. බුලත් ඉලත්තටුව යැ යි ද කියැවෙන හෙයින් ද, එ ද තළා කොළ වැනි අනෙක් කොළ ද බුලත් සෙයින් සැපීමට ගැනුණු හෙයින් ද මෙහින් ඉලතටුව නම් සැපීමට ගන්නා කවර කොළ වුව ද ලන තටුව යි; මෙහි දු ඉල නම් කොළ මැ යි.

පිල් නම් කවරේ ද? ඒ යෙදෙනුයේ කෙහෙල්, හබරල ඈ මහ කොළ සඳහා යැ. අරුත උසස් අයුරින් වෙසෙසන 'ප' උපසග හා යෙදුණු ඉල් මැ (ප+ඉල්>පිල්) වූ සේ ගනිමු නම් එහි ද ඉල් නම් කොළ යි. පැළ ඉන්නට නමක් වූ කොළ කණුව යන අරුත් ඇති කොපිල් යනු ද ඉල් යනු කොළ බව මැ හඟවයි. කප් නම් කණුව යි.[1] (කප්+ඉල්>කපිල්) කොපිල්.

නිල්[2] නම් ඉල් අනුවූ පැහැය යි. අනු+ඉල්>නු+ඉල්>නිල්.

වප් මසැ වූ වැපිරිල්ලෙහි ඉල් (කොළ) ඇදී නිල්ල[3] ගසනුයේ මේ ඉල් මසෙහි දී යැ. එ හෙයින් ඉල් මස නම් කුඹුරේ ගොයම් කොළ ඇදෙන මස යි - කොළ මස යි.

* * *

1. කප් සිටුවනවා ඈ තන්හි. මෙ ද කපාපු කනුව යි. කප කැපීමෙහි පවතුයෙන් (ධාතුයෙන්) වූ කිරියදුනු (කෘදන්ත) නාමුවෙකි කප් යන්න. වැටට බෙලි කොපිලක් (පැළ ඉන්නක්) ඉන්දන්නැ - ඈ වහර යි.

2. සකුයෙහි නීල යනුයෙන් ලැබෙන මේ, වෙද සකුයෙහි නිල් යනුයෙනුදු ලැබේ. එ හෙයින් නිල් යනු වඩා පැරැණි වදන යි. හෙළ බසෙහි නිල් යන්න නැඟුණේ නු+ඉල් යන වදන් මුල් දෙකෙකිනි. මින් පෙනෙනුයේ හෙළ බස වඩා මැ පැරැණි බව නො වේ නම් අන් කිමෙක් ද?

3. නිල් බව වූයේ නිල්+ඉ>නිලි; නිලි+අ>නිල්ල.